(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 3(2).]

# පාර්ලිමේන්තුවේ අංක 3 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

නිකුත් කළේ 2011 මැයි මස 06 වැනි සිකුරාදා

## 2011 මැයි මස 25 වැනි බදාදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0317/'10

ගරු රවී කරුණානායක මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ලංකා විදුලිබල මණ්ඩලයට ලැබිය යුතු මුළු ණය මුදලේ ප්‍රමාණය කොපමණද;

(ii) ලංකා විදුලිබල මණ්ඩලයට වැඩිම මුදලක් ගෙවිය යුතු ණය ගැතියන් දස දෙනාගේ නම් කවරේද;

(iii) ලංකා විදුලිබල මණ්ඩලයේ අධික ණය බර හේතුවෙන් එය ලබාගත් ණය මුදල් සඳහා ගෙවිය යුතු පොළී ප්‍රමාණය කොපමණද;

(iv) මෙම තත්ත්වයෙන් මිදීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද;

(v) ලංකා විදුලිබල මණ්ඩලය තම ණය හිමියන්ට ගෙවිය යුතු මුදල් ප්‍රමාණය කොපමණද;

(vi) ලංකා විදුලිබල මණ්ඩලය වැඩිම මුදලක් ගෙවිය යුතු ණය හිමියන් දස දෙනාගේ නම් කවරේද;

(vii) පසුගිය වර්ෂ හය තුළ එම මුදල් ලැබිය යුතුව තිබූ දිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) විදුලි මිල ඉහළ යැමට හේතුවී ඇත්තේ ලංකා විදුලිබල මණ්ඩලයේ අකාර්යක්ෂමතාව සහ එය විසින් ලබාගෙන ඇති අධික ණය බව සත්‍යයක්ද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ලංකා විදුලිබල මණ්ඩලයට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ප්‍රකාශිත කොන්දේසි කවරේද;

(ii) ලංකා විදුලි බල මණ්ඩලය එම කොන්දේසි ඉටුකිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද ?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0816/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, මාතර කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, මාතර කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම්, ලිපිනයන් හා දුරකථන අංක කවරේද;

(iii) එම පාසල්වලින් සිසුන් සියයට අඩු පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් කවරේද;

(v) සිසුන් සියයට අඩු පාසල්වලින් දැනට වසා දැමීමට තීරණය කර ඇති පාසල් සංඛ්‍යාව සහ ඒවායේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම කොට්ඨාසයේ ගුරු අතිරික්තයක් ඇති පාසල් තිබේද;

(ii) ගුරු අතිරික්තයක් පවතින විෂයයන් කවරේද;

(iii) එම පාසල්වල නම්, ලිපිනයන් හා දුරකථන අංක කවරේද;

(iv) ගුරු ඌනතා පවතින පාසල්වල නම් කවරේද;

(v) ගුරු ඌනතාවයන් පවතින විෂයයන් කවරේද;

(vi) එම ගුරු ඌනතා පවතින පාසල් සඳහා ගුරුවරුන් ලබාදීමට කටයුතු කරන්නේද;

(vii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0900/'10

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ඌව ප්‍රාග්ධන සමූපකාර සමිතියේ (ඌව ප්‍රාග්ධන සමූපකාර බැංකුව) අධ්‍යක්ෂ මණ්ඩලය සමූපකාර පනතට අනුව පත් කර තිබේද;

(ii) එම අධ්‍යක්ෂ මණ්ඩලය පත්කිරීමේදී නීත්‍යානුකූලව කාරකසභා හා මහසභා රැස්වීම් පවත්වා තිබේද;

(iii) මෙම සමූපකාර සමිතියේ මහසභා රැස්වීම් පැවති ස්ථානය සහ දිනය කවරේද;

(iv) මෙම සමූපකාර සමිතියේ සිටින සාමාජිකයින් සංඛ්‍යාව කොපමණද;

(v) ඔවුන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඌව ප්‍රාග්ධන සමූපකාර සමිතියේ වත්මන් සභාපතිවරයාගේ හා අධ්‍යක්ෂ මණ්ඩලයේ නම් කවරේද;

(ii) එහි සාමාන්‍යාධිකාරිවරයාගේ සහ විධායක නිලධාරීන්ගේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මෙම සමූපකාර සමිති බැංකුවේ හිටපු සභාපතිවරයා හා වත්මන් සභාපතිවරයා සහෝදරයන් බවත්;

(ii) මෙහි සාමාන්‍යාධිකාරිවරිය හිටපු සභාපතිවරයාගේ භාර්යාව බවත්;

(iii) මෙහි සිදුවී ඇති දූෂණ හා වංචාවන් පිළිබඳ විගණන වාර්තාවක් ඉදිරිපත් කර ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඈ) ඉහත (ඇ) (iii) හි සඳහන් විගණන වාර්තාව අනුව නීත්‍යානුකූල ක්‍රියාමාර්ගයක් ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0978/'10

ගරු එම්. ටී. හසන් අලි මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) කොළඹ මහ නගර සභාවේ සහකාර වැද්දුම්කරු තනතුර දරමින් සිටියදී, වර්ෂ 2008-11-20 දින විශ්‍රාම ගිය ඒ. එච්. එම්. මහ්රූෆ් මහතාට විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ලබාදෙන ප්‍රදානයන් සහ විශ්‍රාම වැටුප් ගණනය කිරීමේදී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් (HRC/2505/05 හා 2007-06-14 දින) ලබා දී ඇති නියෝග අනුව, වර්ෂ 1989-4-27 දින සිට සහකාර වැද්දුම්කරු තනතුරේ ස්ථිර සේවකයෙකු ලෙස හා 1989 සිට පුහුණු I පන්තියේ II ශ්‍රේණියේ වැද්දුම්කරු තනතුරට උසස්වීම් ලද අයෙකු ලෙස සැලකිය යුතු බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) එසේ නම්, එම කරුණු සලකමින් මහ්රූෆ් මහතාගේ විශ්‍රාම වැටුප සහ ඊට අදාළව හිමිවිය යුතු සියලු දීමනා සකසා නොපමාව ලබාදීමට පියවර ගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1012/'10

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකාවේ දැනට තිබෙන ආයුර්වේද රෝහල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතුරින් කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ඇති ආයුර්වේද රෝහල් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත අ(i) හි සඳහන් ප්‍රධාන ආයුර්වේද රෝහල්වලට අමතරව පළාත් පාලන ආයතන යටතේ පාලනය වන හෝ නොවන ග්‍රාමීය මට්ටමේ ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථාන ඇති බවත්;

(ii) එම මධ්‍යස්ථානවලට අවශ්‍ය ඖෂධ වර්ග ප්‍රමාණවත්ව නොලැබෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) ප්‍රමාණවත් තරම් ඖෂධ නොලැබෙන ආයුර්වේද මධ්‍යස්ථානවලට ඖෂධ ලබාදීම සඳහා මධ්‍යම රජයේ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මගින් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1017/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 අවසන් වන විට ශ්‍රී ලංකාවේ වාර්තා වූ "අඩු උපත් බර" නමැති මන්දපෝෂණ තත්ත්වය සහිත දරුවන්ගේ ප්‍රතිශතය කොපමණද;

(ii) අඩු උපත් බර සහිත දරුවන්ගේ ප්‍රතිශතය අඩුකිරීම සඳහා රජය ගන්නා වූ ක්‍රියාමාර්ග කවරේද;

(iii) එම ක්‍රියාමාර්ග ඉහත මන්දපෝෂණ තත්ත්වය අඩුකිරීම සඳහා ප්‍රමාණවත්වේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0333/'10

ගරු රවී කරුණානායක මහතා,— පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මකවන මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම එක් එක් මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා සඳහා ආණ්ඩුව සහ විපක්ෂය නියෝජනය කරමින් දැනට තේරී පත්වී සිටින මන්ත්‍රීවරුන්ගේ නම්, උපන් දිනයන් සහ දේශපාලන පක්ෂ කවරේද;

(iii) මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකුට හිමි වරප්‍රසාද කවරේද;

(iv) ඉහත ආයතනයන්හි සේවය කරන සම්පූර්ණ සේවක සංඛ්‍යාව කොපමණද;

(v) වැටුප් සඳහා මසකට වැයවන සම්පූර්ණ මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0817/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, මාතර කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, දික්වැල්ල කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම්, ලිපිනයන් හා දුරකථන අංක කවරේද;

(iii) එම පාසල්වලින් සිසුන් සියයට අඩු පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) සිසුන් සියයට අඩු පාසල්වලින් දැනට වසා දැමීමට තීරණය කර ඇති පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම කොට්ඨාසයේ ගුරු අතිරික්තයක් ඇති පාසල් තිබේද;

(ii) එම පාසල්වල නම්, ලිපිනයන් හා දුරකථන අංක කවරේද;

(iii) ගුරු ඌනතා පවතින පාසල්වල නම් කවරේද;

(iv) ගුරු ඌනතාවයන් පවතින විෂයයන් කවරේද;

(v) එම ගුරු ඌනතා පවතින පාසල් සඳහා ගුරුවරුන් ලබාදීමට කටයුතු කරන්නේද;

(vi) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0902/'10

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ඌව ප්‍රාග්ධන සමූපකාර සමිතියට අනුබද්ධ බැංකුවේ ආරම්භ කර ඇති ළමා ඉතිරි කිරීම් ගිණුම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගිණුම් හිමියන්ගේ නම් කවරේද;

(iii) මෙම බැංකුවේ තැන්පත් කරන මුදල්වලින් බැංකුවේ නිලධාරීන්ට හා වෙනත් පුද්ගලයින්ට ණය මුදල් ලබාදී තිබේද;

(iv) එසේ නම්, ණය ලබා දී ඇති අයගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එලෙස ලබාගත් ණය මුදල් ආපසු ගෙවීම පැහැර හැර ඇති බවත්;

(ii) ගෙවීම් පැහැර හැර ඇති අය සම්බන්ධව එම බැංකුව මගින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) එම ණය ගෙවීම් පැහැර හැර ඇති අයගේ නම් කවරේද;

(ii) ඔවුන් සම්බන්ධයෙන් ගනු ලබන නීතිමය පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0980/'10

ගරු එම්. ටී. හසන් අලි මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ශ්‍රී ලංකාවේ සිට සෞදි අරාබියාවේ ගෘහ සේවිකාවක් ලෙස සේවයට ගිය, රිසානා නෆීක් මෙනෙවියට එරට අධිකරණය මගින් මරණ දඬුවම් නියම කොට ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) රිසානා නෆීක් මෙනෙවිය ශ්‍රී ලංකාවේ සිට ගෘහ සේවිකාවක් ලෙස පිටත්ව ගිය දිනය, ඇයගේ ගමන් බලපත්‍ර අංකය, එහි සඳහන් උපන් දිනය සහ එය නිකුත් කළ දිනය කවරේද;

(ii) ඇයගේ ශ්‍රී ලංකා ගමන් බලපත්‍ර අයදුම්පත සහතික කරන ලද සාම විනිසුරුවරයාගේ නම සහ ලිපිනය කවරේද;

(iii) රිසානා මෙනෙවියගේ උප්පැන්න සහතිකයේ සඳහන් උපන් දිනය, ලියාපදිංචි අංකය හා දිනය සහ ලියාපදිංචි බල ප්‍රදේශය කවරේද;

(iv) ඇයගේ ජාතික හැඳුනුම්පතේ සඳහන් උපන් දිනය හා ජාතික හැඳුනුම්පතේ අංකය කවරේද;

(v) රිසානා මෙනවියට විදේශගතවීමට සහායවූ විදේශ රැකියා නියෝජිත ආයතනයේ නම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ඇයට සෞදි අරාබියාවේ අධිකරණය විසින් මරණ දඬුවම නියම කළ දිනය හා අභියාචනාධිකරණයේ තීන්දුව ප්‍රකාශ කළ දිනය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1013/'10

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අප රට තුළ සිටින වයස අවුරුදු 15ට අඩු දරුවන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම දරුවන් අතරින් මන්දපෝෂණයෙන් පෙළෙන දරුවන් සංඛ්‍යාව කොපමණද;

(iii) මන්දපෝෂණ තත්ත්වය නිසා 2009 වර්ෂය තුළ ඉහත වයස් කාණ්ඩයේ දරුවන් මියගොස් ඇති බවට වාර්තා තිබේද;

(iv) එසේ නම්, එම තත්වය වළක්වාලීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1018/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 අවසන් වන විට කුරුවීම හෙවත් මිටිවීම යන මන්දපෝෂණ තත්ත්වයට ගොදුරු වී ඇති ශ්‍රී ලංකාවේ ළදරු ප්‍රතිශතය කොපමණද?

(ii) එම මන්දපෝෂණ තත්ත්වය අඩුකිරීමට රජය ගන්නා වූ ක්‍රියාමාර්ග කවරේද;

(iii) එම ක්‍රියාමාර්ග මිටිවීමේ මන්දපෝෂණ තත්ත්වය තුරන්කිරීමට තරම් ප්‍රමාණවත් වන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0427/'10

ගරු රවී කරුණානායක මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට ජාත්‍යන්තර කමිටුවක් තිබේද;

(ii) එසේ නම්, එම කමිටුවේ සිටින සාමාජිකයින්ගේ නම් කවරේද;

යන්න එතුමා දන්වන්නෙහිද?

(ආ) (i) 2010 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සමඟ ගිවිසුම් අත්සන් කළ ක්‍රිකට් ක්‍රීඩකයන්ගේ නම් කවරේද;

(ii) ඉහත එක් එක් ක්‍රිකට් ක්‍රීඩකයාට ලබාදුන් මූල්‍යමය පැකේජය වෙන් වෙන් වශයෙක් කොපමණද;

(iii) 2005 සිට 2009 දක්වා කාල සීමාව තුළ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් ගෙවීම් කරන ලද ක්‍රිකට් ක්‍රීඩකයන්ගේ නම් කවරේද;

(iv) එම එක් එක් ක්‍රීඩකයා සඳහා ලබා දුන් මූල්‍යමය පැකේජය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0818/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, මාතර කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, දික්වැල්ල කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල යටිතල පහසුකම් සහ පොදු අවශ්‍යතාවයන්ගේ ඌනතාවයන් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) එම පාසල් පද්ධතිය තුළ ඇති,

(i) විදුලිය නොමැති පාසල් සංඛ්‍යාව;

(ii) පුස්තකාල සහ විද්‍යාගාර පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව;

(iii) ගුරු නිවාස සංඛ්‍යාව;

(iv) විදුලිය නොමැති ගුරු නිවාස සංඛ්‍යාව;

(v) ලී බඩු අවශ්‍යතා ඇති පාසල් සංඛ්‍යාව;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත අඩුපාඩු සහිත පාසල්වල නම්, ලිපිනයන් සහ දුරකථන අංක කවරේද;

(ii) එම අඩුපාඩු සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කරදීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1019/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 අවසන් වන විට ශ්‍රී ලංකාවේ වාර්තා වූ අඩු බර දරුවන් නමැති මන්ද පෝෂණ තත්ත්වය ඇති දරුවන්ගේ ප්‍රතිශතය කොපමණද;

(ii) අඩු බර දරුවන්ගේ ප්‍රතිශතය අඩුකිරීමට රජය ගන්නා වූ ක්‍රියාමාර්ග කවරේද;

(iii) එම ක්‍රියාමාර්ග ඉහත මන්දපෝෂණ තත්ත්වය අඩුකිරීමට ප්‍රමාණවත්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් ආඥාපනත යටතේ නියෝගය (අංක 1),— (420 වැනි අධිකාරය වන) ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් ආඥාපනතේ 4 වැනි වගන්තියේ 3 වැනි උපවගන්තිය යටතේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා විසින් පනවනු ලදුව, 2011 පෙබරවාරි 25 දිනැති අංක 1694/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.05.03 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් ආඥාපනත යටතේ නියෝගය (අංක 2),— (420 වැනි අධිකාරය වන) ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් ආඥාපනතේ 4 වැනි වගන්තියේ 3 වැනි උපවගන්තිය යටතේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා විසින් පනවනු ලදුව, 2011 පෙබරවාරි 25 දිනැති අංක 1694/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.05.03 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් ආඥාපනත යටතේ නියෝගය (අංක 3),— (420 වැනි අධිකාරය වන) ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් ආඥාපනතේ 4 වැනි වගන්තියේ 3 වැනි උපවගන්තිය යටතේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා විසින් පනවනු ලදුව, 2011 පෙබරවාරි 25 දිනැති අංක 1694/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.05.03 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— මුදල් පනත යටතේ නියෝගය,— 2009 අංක 13 දරන මුදල් (සංශෝධන) පනතින් අවසන්වරට සංශෝධිත 2002 අංක 11 දරන මුදල් පනතේ 2 වන වගන්තිය යටතේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා විසින් වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු සම්බන්ධයෙන් පනවන ලදුව, 2011 ජනවාරි 17 දිනැති අංක 1689/2 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරනු පළ කරනු ලැබ, 2011.05.03 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා,— බුද්ධිමය දේපළ පනත යටතේ නියෝගය,— 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනතේ 5 වැනි, 9 වැනි සහ 17 වැනි වගන්ති සමඟ කියවිය යුතු 204 වැනි වගන්තිය යටතේ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා විසින් පනවනු ලැබ 2011 ජනවාරි 05 දිනැති අංක 1687/28 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.05.03 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

ඕලගංගල මහා සුදර්ශන පරෝපකාරී පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2011 මැයි මස 25 වැනි බදාදා)**

0205/'10

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පස්සර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනතට අනුව ආරම්භයේ දී කොමිෂන් සභාව සතු වූ මුළු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ අතුරින් මේ වන විට විකුණා ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එයින් අක්කර 5 ට වැඩි විකුණුම්වල ඉඩමේ නම, ප්‍රමාණය, විකුණූ දිනය, ගැනුම්කරු සහ විකුණූ මුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉතිරි ඉඩම්වලින් කිසිවක් දීර්ඝකාලීන බදු පදනම යටතේ ලබා දී තිබේද;

(ii) එසේ නම්, ලබාදුන් ඉඩමේ නම, බදු ගැනුම්කරු හා ලබාදුන් දිනය, ලබාගත් බදු මුදල සහ බදු අවසන් වන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) එසේ නොවිකුණා හෝ බදු නොදී ඉතිරිව ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒවා ග්‍රාම නිලධාරී වසම් අනුව අක්කර වශයෙන් කොපමණද;

(iii) එම ඉඩම් පිහිටි ස්ථාන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0206/'10

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනතට අනුව ආරම්භයේ දී කොමිෂන් සභාව සතු වූ මුළු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ අතුරින් මේ වන විට විකුණා ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එයින් අක්කර 5 ට වැඩි විකුණුම්වල ඉඩමේ නම, ප්‍රමාණය, විකුණූ දිනය, ගැනුම්කරු සහ විකුණූ මුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉතිරි ඉඩම්වලින් කිසිවක් දීර්ඝකාලීන බදු පදනම යටතේ ලබා දී තිබේද;

(ii) එසේ නම්, ලබාදුන් ඉඩමේ නම, බදු ගැනුම්කරු හා ලබාදුන් දිනය, ලබාගත් බදු මුදල සහ බදු අවසන් වන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) එසේ නොවිකුණා හෝ බදු නොදී ඉතිරිව ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒවා ග්‍රාම නිලධාරී වසම් අනුව අක්කර වශයෙන් කොපමණද;

(iii) එම ඉඩම් පිහිටි ස්ථාන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0207/'10

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) හාලිඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනතට අනුව ආරම්භයේ දී කොමිෂන් සභාව සතු වූ මුළු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ අතුරින් මේ වන විට විකුණා ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එයින් අක්කර 5 ට වැඩි විකුණුම්වල ඉඩමේ නම, ප්‍රමාණය, විකුණූ දිනය, ගැනුම්කරු සහ විකුණූ මුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉතිරි ඉඩම්වලින් කිසිවක් දීර්ඝකාලීන බදු පදනම යටතේ ලබා දී තිබේද;

(ii) එසේ නම්, ලබාදුන් ඉඩමේ නම, බදු ගැනුම්කරු හා ලබාදුන් දිනය, ලබාගත් බදු මුදල සහ බදු අවසන් වන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) එසේ නොවිකුණා හෝ බදු නොදී ඉතිරිව ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒවා ග්‍රාම නිලධාරී වසම් අනුව අක්කර වශයෙන් කොපමණද;

(iii) එම ඉඩම් පිහිටි ස්ථාන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0208/'10

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනතට අනුව ආරම්භයේ දී කොමිෂන් සභාව සතු වූ මුළු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ අතුරින් මේ වන විට විකුණා ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එයින් අක්කර 5 ට වැඩි විකුණුම්වල ඉඩමේ නම, ප්‍රමාණය, විකුණූ දිනය, ගැනුම්කරු සහ විකුණූ මුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉතිරි ඉඩම්වලින් කිසිවක් දීර්ඝකාලීන බදු පදනම යටතේ ලබා දී තිබේද;

(ii) එසේ නම්, ලබාදුන් ඉඩමේ නම, බදු ගැනුම්කරු හා ලබාදුන් දිනය, ලබාගත් බදු මුදල සහ බදු අවසන් වන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) එසේ නොවිකුණා හෝ බදු නොදී ඉතිරිව ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒවා ග්‍රාම නිලධාරී වසම් අනුව, අක්කර වශයෙන් කොපමණද;

(iii) එම ඉඩම් පිහිටි ස්ථාන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0209/'10

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) හපුතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනතට අනුව ආරම්භයේ දී කොමිෂන් සභාව සතු වූ මුළු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ අතුරින් මේ වන විට විකුණා ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එයින් අක්කර 5 ට වැඩි විකුණුම්වල ඉඩමේ නම, ප්‍රමාණය, විකුණූ දිනය, ගැනුම්කරු සහ විකුණූ මුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉතිරි ඉඩම්වලින් කිසිවක් දීර්ඝකාලීන බදු පදනම යටතේ ලබා දී තිබේද;

(ii) එසේ නම්, ලබාදුන් ඉඩමේ නම, බදු ගැනුම්කරු හා ලබාදුන් දිනය, ලබාගත් බදු මුදල සහ බදු අවසන් වන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) එසේ නොවිකුණා හෝ බදු නොදී ඉතිරිව ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒවා ග්‍රාම නිලධාරී වසම් අනුව අක්කර වශයෙන් කොපමණද;

(iii) එම ඉඩම් පිහිටි ස්ථාන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0210/'10

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනතට අනුව ආරම්භයේ දී කොමිෂන් සභාව සතු වූ මුළු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ අතුරින් මේ වන විට විකුණා ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එයින් අක්කර 5 ට වැඩි විකුණුම්වල ඉඩමේ නම, ප්‍රමාණය, විකුණූ දිනය, ගැනුම්කරු සහ විකුණූ මුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉතිරි ඉඩම්වලින් කිසිවක් දීර්ඝකාලීන බදු පදනම යටතේ ලබා දී තිබේද;

(ii) එසේ නම්, ලබාදුන් ඉඩමේ නම, බදු ගැනුම්කරු හා ලබාදුන් දිනය, ලබාගත් බදු මුදල සහ බදු අවසන් වන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) එසේ නොවිකුණා හෝ බදු නොදී ඉතිරිව ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒවා ග්‍රාම නිලධාරී වසම් අනුව, අක්කර වශයෙන් කොපමණද;

(iii) එම ඉඩම් පිහිටි ස්ථාන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2011 මැයි මස 26 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0430/'10

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) රජයට අයත් සංස්ථා, මණ්ඩල යනාදී ආයතන සඳහා අද වන විට ආයෝජනය කර ඇති ප්‍රාග්ධන ප්‍රමාණය සඳහන් කරමින්, එම සියලු ආයතනවල නම් කවරේද;

(ii) පසුගිය වර්ෂ තුනක කාලය තුළදී එකී ආයතනවල සේවය කළ පුද්ගලයන්ගේ සංඛ්‍යාව කොපමණද;

(iii) එම ආයතනවල රජය සතු කොටස් ප්‍රමාණය කොපමණද;

(iv) ඉහත (අ) (i) හි සඳහන් ආයතනවල පසුගිය වර්ෂය සඳහා එක් එක් ආයතනයේ ලාභය හෝ පාඩුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) (අ) (i) හි සඳහන් මුළු ආයතන සංඛ්‍යාවෙන් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව සහ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත වාර්තා නොකරන සංඛ්‍යාව කොපමණද;

(ii) එසේ වාර්තා නොකිරීමට හේතුව කවරේද;

(iii) එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 වගන්තිය උල්ලංඝනය කිරීමක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0624/'10

ගරු ආර්. යෝගරාජන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) කොළඹ 12, හුසේනියා මාවත, අංක 45 හි පිහිටි හමීඩ් අල් හුසේනියා විද්‍යාලයෙහි බරපතළ ගුරු හිඟයක් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත පාසල සඳහා අනුමත වී ඇති එක් එක් විෂය සඳහා වූ සිංහල සහ දෙමළ මාධ්‍ය ගුරුවරු සංඛ්‍යාව කවරේද;

(ii) එක් එක් විෂය සඳහා එක් එක් මාධ්‍යයෙන් සිටින ගුරුවරු සංඛ්‍යාව කවරේද;

(iii) එක් එක් විෂය සඳහා එක් එක් මාධ්‍යයෙන් පවතින ගුරු හිඟය කොපමණද;

(iv) ඉහත සඳහන් ගුරු හිඟයට පිළියම් යෙදීම පිණිස ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(v) එම ක්‍රියාමාර්ග ගනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) රාජකීය, ආනන්ද සහ නාලන්ද විද්‍යාලවල ගුරු අතිරික්තයක් පවතින බව එතුමා දන්නෙහිද?

(ඈ) (i) ඉහත (ඇ) කොටසෙහි සඳහන් පාසල්වල සිටින අතිරික්ත ගුරුවරු සංඛ්‍යාව එක් එක් මාධ්‍ය අනුව සහ එක් එක් විෂය අනුව කොපමණද;

(ii) පවතින පුරප්පාඩු පිරවීම සඳහා මෙම අතිරික්ත ගුරුවරු හමීඩ් අල් හුසේනියා විද්‍යාලයට මාරු කිරීම සඳහා පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0819/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මාතර දිස්ත්‍රික්කයේ මාතර කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් දෙවිනුවර කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල යටිතල පහසුකම් සහ පොදු අවශ්‍යතාවයන්ගේ ඌනතාවයන් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) එම පාසල් පද්ධතිය තුළ ඇති,

(i) විදුලිය නොමැති පාසල් සංඛ්‍යාව;

(ii) පුස්තකාල සහ විද්‍යාගාර පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව;

(iii) ගුරු නිවාස සංඛ්‍යාව;

(iv) විදුලිය නොමැති ගුරු නිවාස සංඛ්‍යාව;

(v) ලී බඩු අවශ්‍යතා ඇති පාසල් සංඛ්‍යාව;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත අඩුපාඩු සහිත පාසල්වල නම්, ලිපිනයන් සහ දුරකථන අංක කවරේද;

(ii) එම අඩුපාඩු සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කරදීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0906/’10

ගරු මොහමඩ් අස්ලම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) පුත්තලම දිස්ත්‍රික්කයේ, කල්පිටිය කලාප අධ්‍යාපන කොට්ඨාසයේ පිහිටි දෙදහසකට අධික ශිෂ්‍යයින් සංඛ්‍යාවක් අධ්‍යාපනය ලබන අල්-අක්ෂා ජාතික පාසලේ මේ වන විට විවිධ විෂයයන්ට අදාළව විසිදෙනෙකුටත් වැඩි ගුරු හිඟයක් සහ භෞතික සම්පත් හිඟයක් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) එම පාසලේ පවතින උග්‍ර ගුරු හිඟය පියවීමටත්, ශ්‍රවණාගාර පහසුකම් ඇතුළු අවශ්‍ය භෞතික සම්පත් ලබාදීමටත් පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0926/’10

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කොළඹ වරායේ නව කන්ටේනර් පර්යන්ත ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත සම්පූර්ණ පිරිවැය;

(ii) එම සම්පූර්ණ පිරිවැයෙන් දේශීයව සපුරා ගන්නා ප්‍රමාණය;

(iii) විදේශීයව සපුරා ගන්නා ප්‍රමාණය;

(iv) එම ව්‍යාපෘතිය සඳහා අරමුදල් ලැබෙන මාර්ග;

(v) සම්පූර්ණ පිරිවැයෙන් ණය වශයෙන් ලැබෙන ප්‍රමාණය;

(vi) ණය මුදල් ප්‍රදානය කරනු ලබන රටවල්, අදාළ පොලී ප්‍රමාණයන් සහ ණය පියවීමේ කාල සීමාවන්;

(vii) සම්පූර්ණ ව්‍යාපෘතිය නිම කිරීමට ගතවන කාල සීමාව;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම ව්‍යාපෘතියේ වැඩ කටයුතු සඳහා ශ්‍රමිකයින් බඳවා ගන්නා ක්‍රමය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0981/’10

ගරු එම්. ටී. හසන් අලි මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සෞදි අරාබි රාජ්‍යයේ ක්‍රියාත්මක වන නීතිය ඉස්ලාමීය ෂරීආ නීතිය බවත්;

(ii) ඉස්ලාමීය ෂරීආ නීතිය අනුව අධිකරණය විසින් යම් පුද්ගලයෙකුට මරණ දඬුවමක් නියම කිරීමේදී අදාළ වැරදිකරු නීති විරෝධී ක්‍රියාව හෝ අපරාධය සිදුකරන දිනය වන විට වයස අවුරුදු 18 ක් සම්පූර්ණවීම සැලකිල්ලට ගන්නා බවත්;

(iii) මේ වන විට සෞදි අරාබියේදී මරණ දඬුවම නියමවී ඇති රිසානා නෆීක් මෙනෙවිය එම අපරාධ චෝදනාවට ලක්වන අවස්ථාවේ දී ඇගේ සැබෑ වයස අවුරුදු 17ක් බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එසේ නම්, රිසානා මෙනෙවියට ව්‍යාජ උප්පැන්න සහතිකය, ජාතික හැඳුනුම්පත, ශ්‍රී ලංකා ගමන් බලපත්‍ර නිකුත් කිරීමට සහායවූ නිලධාරීන්ට, ශ්‍රී ලංකා ගමන් බලපත්‍ර අයදුම්පත්‍රය සහතිකය කරන ලද සාම විනිසුරුවරයාට සහ විදේශගතවීමට සහායවූ විදේශ නියෝජිත ආයතන හිමියාට එරෙහිව මේ වනවිටත් ගෙන ඇති පියවර කවරේද;

(ii) රිසානාට එරෙහිව එරටේ අධිකරණයේ නඩු විභාගය පැවැත්වෙන අවස්ථාවේදී නිසි පරිදි කරුණු ඉදිරිපත් කිරීමට අපොහොසත්වූ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය ඇයට එම දඬුවම හිමිවීම සම්බන්ධ සම්පූර්ණ වගකීම බාර ගත යුතු බව පිළිගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1021/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 අවසන් වන විට ශ්‍රී ලංකාවේ නීරක්තියෙන් පෙළෙන බවට වාර්තා වී ඇති ගර්භණී මව්වරුන්ගේ ප්‍රතිශතය කොපමණද;

(ii) ගර්භණී මව්වරුන් අතර පවතින නීරක්තිය නැති කිරීම සඳහා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) රජයේ එම ක්‍රියා මාර්ග ගර්භනී මව්වරුන්ගේ නීරක්තිය අවම කිරීම සඳහා ප්‍රමාණවත්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1090/'11

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) (i) හෙළතුරු වියන වැඩසටහන යටතේ මෙතෙක් යුකැලිප්ටස් (Eucalyptus) සහ පයිනස් (Pinus) වගාවන් ඉවත් කර දේශීය ශාක ස්ථාපිත කරන ලද භූමි ප්‍රමාණය අක්කර කොපමණද;

(ii) එම ප්‍රදේශවල වගා කිරීම සඳහා තෝරා ගන්නා ලද දේශීය ශාක විශේෂ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම දේශීය ශාක තෝරා ගැනීමේදී යුකැලිප්ටස් සහ පයිනස් වගා මගින් ජාතික දැව ඉල්ලුම සපුරාලීමට ලබාදෙන දායකත්වය ඒ හා සමානව සම්පූර්ණ කළ හැකි ආකාරයේ දේශීය ශාක විශේෂ තෝරාගැනීමට අවධානය ලබාදී තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1060/'11

ගරු වසන්ත අලුවිහාරේ මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මාතලේ - රත්තොට මාර්ගය සංවර්ධනය කිරීම ආරම්භකර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා මිනුම් කටයුතු අවසන් කර මාර්ග සැලසුම් සකස් කර තිබේද;

(ii) එම ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු ගත මුදල කොපමණද;

(iii) ඒ සඳහා වෙන් කර ඇති මුදල කොපමණද?

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) මෙම මාර්ගය පුලුල් කිරීමේ කටයුතු වලදී,

(i) පවරා ගනු ලබන ඉඩම් ප්‍රමාණය හා කඩා ඉවත් කරනු ලබන නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම ඉඩම් හා නිවාස අහිමි වන අයගේ නම් කවරේද;

(iii) ඉහත දේපල පවරා ගැනීමට අදාළව ගැසට් නිවේදනයක් නිකුත් කර තිබේද;

(iv) ගැසට් නිවේදනයක් නිකුත් කර නොමැති නම් ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත මාර්ගය පුලුල් කිරීමේදී පවරා ගනු ලබන දේපල වෙනුවෙන් වන්දි ලබා දෙන්නේද;

(ii) ඒ සඳහා වෙන්කර ඇති මුදල කොපමණද;

(iii) එම වන්දි මුදල් ගෙවා නිම කරන දිනය කවරේද;

(iv) පවරා ගනු ලබන ඉඩම් සඳහා විකල්ප ඉඩම් ලබා දෙන්නේද;

(v) එසේ නම්, එම ඉඩම් ලබාදෙන ස්ථානය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0450/'10

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පසුගිය වසර පහ සඳහා;

(i) ජාතික ලොතරැයි මණ්ඩලයේ ලාභය හෝ අලාභය කවරේද;

(ii) එම එක් එක් වර්ෂයේ දෙසැම්බර් 31 වැනි දිනට ඉහත සඳහන් ආයතනයේ ශේෂ පත්‍රයේ තත්ත්වය කවරේද;

යන්න එතුමා වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ආ) පසුගිය වසර පහ සඳහා වූ එක් එක් වර්ෂයේ මූල්‍ය වාර්තා සමඟ ලබා දුන් විගණන වාර්තා පිළිබඳව එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ජාතික ලොතරැයි මණ්ඩලයේ සේවය කරන පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(ii) පසුගිය වසර පහ සඳහා එක් එක් වර්ෂයේදී ජාතික ලොතරැයි මණ්ඩලය විසින් රජයට ලබා දී ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0820/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මාතර දිස්ත්‍රික්කයේ මාතර කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් වැලිගම කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල යටිතල පහසුකම් සහ පොදු අවශ්‍යතාවයන්ගේ ඌනතාවයන් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) එම පාසල් පද්ධතිය තුළ ඇති,

(i) විදුලිය නොමැති පාසල් සංඛ්‍යාව;

(ii) පුස්තකාල සහ විද්‍යාගාර පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව;

(iii) ගුරු නිවාස සංඛ්‍යාව;

(iv) විදුලිය නොමැති ගුරු නිවාස සංඛ්‍යාව;

(v) ලී බඩු අවශ්‍යතා ඇති පාසල් සංඛ්‍යාව;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත අඩුපාඩු සහිත පාසල්වල නම්, ලිපිනයන් සහ දුරකථන අංක කවරේද;

(ii) එම අඩුපාඩු සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කරදීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1024/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්තමානයේ අප රටේ වනජීවීන් සංරක්ෂණය කිරීමේ ජාතික සැලැස්මක් තිබේද;

(ii) එසේ නම්, එය කාලවකවානු සහ ඉලක්ක සහිතව ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන්නේද;

(iii) එම සැලැස්ම ක්‍රියාත්මක කිරීම උදෙසා ප්‍රමාණවත් සම්පත් අදාළ අමාත්‍යාංශය සතුව තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1046/'10

ගරු මොහමඩ් අස්ලම් මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2007 (2008) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ තුන්වැනි ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම සඳහා විවෘත තරඟ විභාගයක් පවත්වනු ලැබූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම තරඟ විභාගය සමත්ව සුදුසුකම් ලැබූවන් සඳහා සම්මුඛ පරීක්‍ෂණ පවත්වන ලැබුවේද;

(ii) එසේ නම්, සම්මුඛ පරීක්ෂණ පැවැත්වූ දිනයන් කවරේද;

(iii) සම්මුඛ පරීක්ෂණවලින් පසුව අදාළ තනතුර සඳහා බඳවාගත් සංඛ්‍යාව කොපමණද;

(iv) බඳවාගත් අයගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) එම තනතුරට බඳවා ගැනීම සිදුකරනු ලැබුවේ දිස්ත්‍රික් මට්ටමින්ද නැතහොත් ජාතික මට්ටමින්ද;

(ii) සම්මුඛ පරීක්‍ෂණයට කැඳවනු ලැබූ අවම ලකුණු මට්ටම කවරේද;

(iii) ඉහත බඳවාගැනීම සිදුකළ ජනවාර්ගික අනුපාතය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0451/'10

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පසුගිය වර්ෂ පහක කාලය තුළ,

(i) සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ලාභය හෝ පාඩුව කොපමණද;

(ii) එක් එක් වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දිනට එම ආයතනයේ ශේෂ පත්‍රයේ තත්ත්වය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා ප්‍රකාශ කරන්නෙහිද?

(ආ) පසුගිය වර්ෂ පහක කාලය තුළ එක් එක් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තාවේ සඳහන් විගණන වාර්තා වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සේවය කරන සේවකයින් සංඛ්‍යාව කවරේද;

(ii) පසුගිය වර්ෂ පහක කාලය තුළ එක් එක් වර්ෂයේදී සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් රජයට ලබාදුන් මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0821/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මාතර දිස්ත්‍රික්කයේ මාතර කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් මාතර කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල යටිතල පහසුකම් සහ පොදු අවශ්‍යතාවයන්ගේ ඌනතාවයන් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) එම පාසල් පද්ධතිය තුළ ඇති,

(i) විදුලිය නොමැති පාසල් සංඛ්‍යාව;

(ii) පුස්තකාල සහ විද්‍යාගාර පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව;

(iii) ගුරු නිවාස සංඛ්‍යාව;

(iv) විදුලිය නොමැති ගුරු නිවාස සංඛ්‍යාව;

(v) ලී බඩු අවශ්‍යතා ඇති පාසල් සංඛ්‍යාව;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත අඩුපාඩු සහිත පාසල්වල නම්, ලිපිනයන් සහ දුරකථන අංක කවරේද;

(ii) එම අඩුපාඩු සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කරදීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

## (2011 මැයි මස 26 වැනි බ්‍රහස්පතින්දා)

0211/'10

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනතට අනුව ආරම්භයේ දී කොමිෂන් සභාව සතු වූ මුළු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ අතුරින් මේ වන විට විකුණා ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එයින් අක්කර 5 ට වැඩි විකුණුම්වල ඉඩමේ නම, ප්‍රමාණය, විකුණූ දිනය, ගැනුම්කරු සහ විකුණූ මුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉතිරි ඉඩම්වලින් කිසිවක් දීර්ඝකාලීන බදු පදනම යටතේ ලබා දී තිබේද;

(ii) එසේ නම්, ලබාදුන් ඉඩමේ නම, බදු ගැනුම්කරු හා ලබාදුන් දිනය, ලබාගත් බදු මුදල සහ බදු අවසන් වන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) එසේ නොවිකුණා හෝ බදු නොදී ඉතිරිව ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒවා ග්‍රාම නිලධාරී වසම් අනුව, අක්කර වශයෙන් කොපමණද;

(iii) එම ඉඩම් පිහිටි ස්ථාන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0212/'10

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනතට අනුව ආරම්භයේ දී කොමිෂන් සභාව සතු වූ මුළු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ අතුරින් මේ වන විට විකුණා ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එයින් අක්කර 5 ට වැඩි විකුණුම්වල ඉඩමේ නම, ප්‍රමාණය, විකුණූ දිනය, ගැනුම්කරු සහ විකුණූ මුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉතිරි ඉඩම්වලින් කිසිවක් දීර්ඝකාලීන බදු පදනම යටතේ ලබා දී තිබේද;

(ii) එසේ නම්, ලබාදුන් ඉඩමේ නම, බදු ගැනුම්කරු හා ලබාදුන් දිනය, ලබාගත් බදු මුදල සහ බදු අවසන් වන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) එසේ නොවිකුණා හෝ බදු නොදී ඉතිරිව ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒවා ග්‍රාම නිලධාරී වසම් අනුව, අක්කර වශයෙන් කොපමණද;

(iii) එම ඉඩම් පිහිටි ස්ථාන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0213/'10

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ඌවපරණගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනතට අනුව ආරම්භයේ දී කොමිෂන් සභාව සතු වූ මුළු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ අතුරින් මේ වන විට විකුණා ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එයින් අක්කර 5 ට වැඩි විකුණුම්වල ඉඩමේ නම, ප්‍රමාණය, විකුණූ දිනය, ගැනුම්කරු සහ විකුණූ මුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉතිරි ඉඩම්වලින් කිසිවක් දීර්ඝකාලීන බදු පදනම යටතේ ලබා දී තිබේද;

(ii) එසේ නම්, ලබාදුන් ඉඩමේ නම, බදු ගැනුම්කරු හා ලබාදුන් දිනය, ලබාගත් බදු මුදල සහ බදු අවසන් වන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) එසේ නොවිකුණා හෝ බදු නොදී ඉතිරිව ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒවා ග්‍රාම නිලධාරී වසම් අනුව, අක්කර වශයෙන් කොපමණද;

(iii) එම ඉඩම් පිහිටි ස්ථාන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2011 ජූනි මස 07 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0376/'10

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (5)

(අ) (i) ආනයනික භාණ්ඩ වන කිරි පිටි, ගෑස්, සීනි, පරිප්පු, ළූණු, අර්තාපල්, සහල්, ටින් මාළු සහ ඛනිජ තෙල් මත පැනවෙන තීරු බදු සහ අනෙකුත් සියලු ආකාරයේ බදු ප්‍රමාණ කොපමණද;

(ii) පසුගිය වර්ෂ 10 තුළ ඉහත සඳහන් භාණ්ඩ ආනයනය කරන ලද ප්‍රමාණයන් කොපමණද;

(iii) පසුගිය වර්ෂ 5 තුළ බදු පැනවීමෙන් උපයාගත් ආදායම කොපමණද;

(iv) එකී භාණ්ඩ අතරින් දේශීය වශයෙන් නිෂ්පාදනය කෙරෙන යම් භාණ්ඩ වේ නම්, පසුගිය වර්ෂ 5 තුළ එම භාණ්ඩවල නිෂ්පාදන ප්‍රමාණයන් වාර්ෂික පදනමින් කොපමණද;

(v) පසුගිය වර්ෂ 5 තුළ එම භාණ්ඩවල වාර්ෂික පරිභෝජනය කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0802/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, අකුරැස්ස කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, අකුරැස්ස කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන පාසල්වල යටිතල පහසුකම් සහ පොදු අවශ්‍යතාවයන්ගේ ඌනතාවයන් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) එම පාසල් පද්ධතිය තුළ ඇති,

(i) විදුලිය නොමැති පාසල් සංඛ්‍යාව;

(ii) පුස්තකාල සහ විද්‍යාගාර පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව ;

(iii) ගුරු නිවාස සංඛ්‍යාව;

(iv) විදුලිය නොමැති ගුරු නිවාස සංඛ්‍යාව;

(v) ලී බඩු අවශ්‍යතා ඇති පාසල් සංඛ්‍යාව; සහ

(vi) ඉහත අඩුපාඩු සහිත පාසල්වල නම්, ලිපිනයන් සහ දුරකථන අංක;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත පාසල්වල පවතින අඩුපාඩු සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කරදීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0880/'10

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) 2007, 2008 සහ 2009 වර්ෂ සඳහා ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ සම්පූර්ණ ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද;

(ආ) එම එක් එක් වර්ෂයේදී,

(i) දේශන ගාස්තු වශයෙන් අයකර ගන්නා ලද මුදල;

(ii) නීති විද්‍යාල ප්‍රවේශ විභාගයේ අයදුම්පත් ගාස්තු වශයෙන් අයකර ගත් මුදල;

(iii) එම විභාගයේ විභාග ගාස්තු වශයෙන් අයකර ගත් මුදල;

(iv) වෙනත් ක්‍රම මගින් ශ්‍රී ලංකා නීති විද්‍යාලයට ලැබුණු ආදායම;

(v) ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ වියදම;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ මූල්‍ය කළමනාකරණය විධිමත් කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(ii) 2009 වර්ෂය සඳහා අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ප්‍රගති වාර්තාවේ දක්වා ඇති පරිදි දේශන ගාස්තු වැඩිකිරීමකින් තොරව ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ කටයුතු පවත්වාගෙන යැමට නොහැකිද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) එසේ නම්, ඒ මන්ද?

1030/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 අවසන් වන විට ශ්‍රී ලංකාවේ වතුකරයේ මන්දපෝෂණයෙන් පෙළෙණු ගර්භණී මව්වරුන්ගේ ප්‍රතිශතය කවරේද;

(ii) එම මන්දපෝෂණ තත්වයන් මගහැරවීමට රජය ගන්නා වූ පියවර කවරේද;

(iii) එම පියවර වතුකරයේ ගර්භණී මව්වරුන්ගේ මන්ද පෝෂණය මගහැරවීමට ප්‍රමාණවත්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1045/'10

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සමූපකාර තොග වෙළඳ සංස්ථාව හෙවත් ස.තො.ස. පෞද්ගලීකරණය කරන ලද දිනය කවරේද;

(ii) එවකට පැවති රජය කවරේද;

(iii) එම රජයේ ස.තො.ස. අදාළ විෂය භාර අමාත්‍යවරයා කවරුන්ද;

(iv) ස.තො.ස. පෞද්ගලීකරණයෙන් රජයට සිදු වූ පාඩුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පෞද්ගලීකරණය කරනු ලැබූ ස.තො.ස. නැවත රජයට පවරාගත් දිනය කවරේද;

(ii) එවකට පැවති රජය කවරේද;

(iii) ස.තො.ස නැවත රජයට පවරාගත් වකවානුවේ සිටි අදාල විෂය භාර අමාත්‍යවරයා කවරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1164/'11

ගරු අනුර දිසානායක මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 වර්ෂය තුළ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙහි පන්ති තහනමට ලක්වූ සිසු සංඛ්‍යාව කොපමණද;

(ii) එම සිසු/සිසුවියන්ගේ නම් හා ඔවුන් පන්ති තහනමට ලක් කෙරුනු චෝදනා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඔවුන් අතුරින් විධිමත් පරීක්ෂණයක් පවත්වා අවසන් තීරණයක් ලබා දී ඇති සිසුන් සංඛ්‍යාව කවරේද;

(iv) පන්ති තහනමට ලක්වූ අනෙකුත් සිසුන් සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0449/'10

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වාණිජ බැංකු සම්බන්ධයෙන් ආණ්ඩුවේ ප්‍රතිපත්තිය කවරේද;

(ii) පෞද්ගලික බැංකුවල කොටස් රජය මිලදී ගනිමින් සිටින්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) සේවක අර්ථසාධක අරමුදල මගින් හෝ වෙනත් රාජ්‍ය ආයතනයක් මගින් මේ වනවිට පෞද්ගලික බැංකුවලින් රජය මිලදී ගෙන ඇති මුලු කොටස් ප්‍රමාණය කොපමණද;

(ii) එම එක් එක් බැංකුවෙන් මිලදීගත් කොටස්වල ප්‍රතිශතය සහ ඒ සඳහා වැය කළ සම්පූර්ණ මුදල එම මිලදීගැනීම සිදු කළ දිනයේ සිට එක් එක් වර්ෂයේදී වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) කොටස්වල මිල පහත වැටුණහොත් කොටස් මිලදීගැනීමේ අවදානම දරන්නේ කවරෙක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0822/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, මුලටියන කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, හක්මණ කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම්, ලිපිනයන් හා දුරකථන අංක කවරේද;

(iii) ඒ අතුරින් දැනට වසා ඇති හෝ වැසීමට තීරණය කර ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවායේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම කොට්ඨාසයේ ගුරු අතිරික්තයක් ඇති පාසල්වල හා ගුරු ඌනතා ඇති පාසල්වල නම් කවරේද;

(ii) ගුරු ඌනතාවයන් පවතින විෂයයන් කවරේද;

(iii) මෙම ගුරු ඌනතා පවතින පාසල් සඳහා ගුරුවරුන් ලබා දෙන්නේද;

(iv) ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ඉහත අ (i) හි සඳහන් පාසල් සංඛ්‍යාවෙන්,

(i) විදුලිය නොමැති පාසල් සංඛ්‍යාව;

(ii) ලී බඩු අවශ්‍යතා ඇති පාසල් සංඛ්‍යාව හා එම අවශ්‍යතාවල ස්වභාවය;

(iii) විද්‍යාගාර හා පුස්තකාල පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව සහ ඒවායේ නම්;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) ඉහත සඳහන් පහසුකම් ලබා දීමට අවශ්‍ය ප්‍රතිපාදන එම පාසල් වෙත වෙන් කරදීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0904/'10

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ යුද, නාවික සහ ගුවන් හමුදා සඳහා අවි ආයුධ සහ අනෙකුත් උපකරණ මිලදී ගැනීමේදී සිදුවූ බව කියන අක්‍රමිකතා පිළිබඳ පරීක්ෂණ පැවැත්වීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ගරු ශිරානි තිලකවර්ධන මහත්මිය සභාපතිත්වය දැරූ කොමිෂන් සභාවක් අතිගරු ජනාධිපතිතුමා විසින් පත්කරනු ලැබුවේද;

(ii) එසේ නම්, එම කොමිසම පත්කරන ලද දිනය කවරේද;

(iii) එකී කොමිසමේ සාමාජිකත්වය දැරූ අය කවරුන්ද;

(iv) එම කොමිසමේ වාර්තාව අතිගරු ජනාධිපතිතුමා වෙත භාරදෙන ලද දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම කොමිසමේ විෂයය පරාසය කුමක්ද;

(ii) එමගින් ආවරණය කරන ලද කාලසීමාව කවරේද;

(iii) එම කොමිසන් සභා වාර්තාව පරිදි අක්‍රමිකතා හඳුනාගත්තේ නම්, ඒවා කවරේද;

(iv) එම වාර්තාව සභාගත කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) එම වාර්තාව මගින් අක්‍රමිකතා සඳහා වගකිවයුතු පුද්ගලයින් හඳුනාගෙන තිබේද;

(ii) එසේ නම්, ඒ කවරුන්ද;

(iii) එම තැනැත්තන්ට එරෙහිව මේ වන විට ගෙන ඇති නීතිමය හෝ විනයානුකූල පියවර කවරේද;

(iv) එසේ පියවර නොගන්නේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1032/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 අවසන් වන විට ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ මන්දපෝෂණයෙන් පෙළුණු ගර්භණී මව්වරුන්ගේ ප්‍රතිශතය කවරේද;

(ii) එම මන්දපෝෂණ තත්වයන් මගහැරවීමට රජය ගන්නා වූ පියවර කවරේද;

(iii) එම පියවර උතුරු පළාතේ ගර්භණී මව්වරුන්ගේ මන්ද පෝෂණය මගහැරවීමට ප්‍රමාණවත්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1165/'11

ගරු අනුර දිසානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 1980 සිට 2011 පෙබරවාරි මාසය දක්වා රජයේ සේවකයින් සංඛ්‍යාව වැඩිවී ඇති ආකාරය වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම කාල සීමාව තුළ ජීවන වියදම් දර්ශකය වැඩි වී ඇති ආකාරය වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහළ යන ජීවන වියදමට සාපේක්ෂව රාජ්‍ය සේවකයින්ගේ වැටුප් වැඩිවී නොමැති බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0454/'10

ගරු රවි කරුණානායක මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයා 2010 ජුනි 8 සිට 10 දක්වා සිදු කළ ඉන්දීය සංචාරයේදී දෙමළ ජාතිකයින් සඳහා නිවාස 50,000 ඉදිකිරීම සඳහා ශ්‍රී ලංකාවට රුපියල් බිලියන විසි හතරක් ප්‍රදානය කිරීමට ඉන්දීය රජය එකඟ වූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම අරමුදල් භාවිතා කරමින් අද වන විට ඉදිකර ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිවාස ඉදිකර ඇති ස්ථාන සහ එම නිවාස ලබාදුන් පුද්ගලයන්ගේ නම් කවරේද;

(iii) නිවාස ඉදිකිරීමට පෙර ඉන්දියාව විසින් ලබා දුන් මුදල් ප්‍රමාණය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) නව නිවාස ලබා දීම සඳහා අභ්‍යන්තරිකව අවතැන් වූ පුද්ගලයන් තෝරාගැනීමේදී භාවිතා කළ නිර්ණායක කවරේද;

(ii) ඔවුන් දෙමළ ජාතිකයන්ද; මුස්ලිම් ජාතිකයන්ද; සිංහල ජාතිකයන්ද;

(iii) අවතැන් වූ සියලු පුද්ගලයන් පදිංචි කරවීම සඳහා නව නිවාස කොපමණ සංඛ්‍යාවක් ඉදිකිරීම අවශ්‍ය වන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0823/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, මුලටියන කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, කඹුරුපිටිය කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල යටිතල පහසුකම් සහ පොදු අවශ්‍යතාවයන්ගේ ඌනතාවයන් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) එම පාසල් පද්ධතිය තුළ ඇති,

(i) විදුලිය නොමැති පාසල් සංඛ්‍යාව;

(ii) පුස්තකාල සහ විද්‍යාගාර පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව;

(iii) ගුරු නිවාස සංඛ්‍යාව;

(iv) විදුලිය නොමැති ගුරු නිවාස සංඛ්‍යාව;

(v) ලී බඩු අවශ්‍යතා ඇති පාසල් සංඛ්‍යාව;

(vi) ඉහත අඩුපාඩු සහිත පාසල්වල නම්, ලිපිනයන් සහ දුරකථන අංක;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත පාසල්වල පවතින අඩුපාඩු සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කරදීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1033/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 අවසන් වන විට ශ්‍රී ලංකාවේ, නැගෙනහිර පළාතේ මන්දපෝෂණයෙන් පෙළුණු ගර්භණී මව්වරුන්ගේ ප්‍රතිශතය කවරේද;

(ii) එම මන්දපෝෂණ තත්වයන් මගහැරවීමට රජය ගන්නා වූ පියවර කවරේද;

(iii) එම පියවර නැගෙනහිර පළාතේ ගර්භණී මව්වරුන්ගේ මන්දපෝෂණය මගහැරවීමට ප්‍රමාණවත්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1166/'11

ගරු අනුර දිසානායක මහතා,— ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ පොහොර සහනාධාර වැඩ පිළිවෙළ යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ පොහොර තොග බෙදුම්කරු ලෙස කෘෂිකාර්මික ගොවිජන වගාකරුවන්ගේ සංවිධානය ක්‍රියා කරන්නේද;

(ii) එම සංවිධානය පොහොර බෙදා හැරීම ආරම්භ කළ වර්ෂය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2006 සිට 2010 දක්වා වාර්ෂිකව ඉහත තොග බෙදුම්කරු වෙත සී/ස කොළඹ කොමර්ෂල් පොහොර සමාගම විසින් නිකුත් කළ එක් එක් පොහොර වර්ග තොග ප්‍රමාණය කවරේද;

(ii) වර්ෂ 2009 වන විට එම තොග බෙදුම්කරු විසින් ගොවිජන සේවා මධ්‍යස්ථානවලට බෙදාහරින ලද එක් එක් පොහොර වර්ග ප්‍රමාණයන් කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම බෙදුම්කරුට ලැබුණු පොහොර ප්‍රමාණය හා බෙදා හරින ලද ප්‍රමාණය අතර සංසන්දනයට අනුව තොග ඌනතාවයක් පවතින්නේ නම්, ඒ කොපමණද?

(ii) පොහොර මෙට්‍රික් ටොන් එකක වෙළඳපොළ වටිනාකම අනුව එම ඌන තොගවල වටිනාකම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) ඉහත තත්ත්වය හේතුවෙන් රජයට හා ගොවි ජනතාවට පාඩුවක් සිදුවී ඇති බවත්;

(ii) අදාළ බෙදුම්කරු විසින් වංචාවක් සිදුකර ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2011 ජූනි මස 08 වැනි බදාදා
# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0444/'10

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) පසුගිය වර්ෂ පහ තුළදී වාර්තා වූ අසාර්ථක මූල්‍ය සමාගම් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) තැන්පත්කරුවන් ආරක්ෂා කිරීම ශ්‍රී ලංකා මහ බැංකුවේ වගකීම බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) තැන්පත්කරුවන්ගේ මුදල් භාරගත් සමාගම් මගින් මුදල් ගෙවනු නොලැබූ සමස්ත තැන්පත්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) ගෙවීම පැහැර හරින ලද සමාගම් කවරේද;

(iii) මහ බැංකුව මැදිහත් වී කිසිදු සමාගමක් බංකොලොත්භාවයට පත් නොවනු ඇති බවට සහතිකවීමෙන් පසුවත් 2010.06.01 දිනට IFC සහ CIFC තැන්පත්කරුවන්ට තම ඉතිරිකිරීම් අහිමි වූයේ කෙසේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) එම සමාගම් වල අධ්‍යක්ෂවරුන්ට සිදුවී ඇත්තේ කුමක්ද;

(ii) මෙම මූල්‍ය සමාගම් පිළිබඳ වාර්තා කිරීමේදී බැංකු විසින් අධ්‍යක්ෂවරුන් සම්බන්ධයෙන් එකිනෙකට වෙනස් ප්‍රමිතීන් අනුගමනය කිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට පැහැදිලි කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0559/'10

ගරු අජිත් කුමාර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (5)

(අ) පසුගිය ජනාධිපතිවරණයේදී ඉදිරිපත් කළ මහින්ද චින්තන ඉදිරි දැක්ම යටතේ "විශ්‍රාමික දිවියට අත්වැලක්" යටතේ විශ්‍රාමිකයන්ට සහනයක් වශයෙන් 2006 ට පෙර විශ්‍රාම ලැබූ අයට 2006 වැටුප් ක්‍රමයට ගැලපෙන අයුරින් විශ්‍රාම වැටුප සකස් කොට ඊළඟ අයවැයේ සිට (2010) ක්‍රියාත්මක කරන බවට පොරොන්දු වූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඒ අනුව 2010 අයවැයේදී 2006 ට පෙර විශ්‍රාම ගිය අයට, 2006 වැටුප් ක්‍රමයට ගැලපෙන ලෙස විශ්‍රාම වැටුප් ගෙවීමට කටයුතු කර තිබේද;

(ii) ඒ සඳහා වෙන් කොට ඇති මුදල කොපමණද;

(iii) එම සහනය 2010 අය වැයෙන් ලබා දී නැත්නම්, ඊට හේතු කවරේද;

(iv) එම විශ්‍රාම වැටුප් වැඩිවීම ලබා දෙන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0803/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, අකුරැස්ස කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, මාලිම්බඩ කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල යටිතල පහසුකම් සහ පොදු අවශ්‍යතාවයන්ගේ ඌනතාවයන් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) එම පාසල් පද්ධතිය තුළ ඇති,

(i) විදුලිය නොමැති පාසල් සංඛ්‍යාව;

(ii) පුස්තකාල සහ විද්‍යාගාර පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව;

(iii) ගුරු නිවාස සංඛ්‍යාව;

(iv) විදුලිය නොමැති ගුරු නිවාස සංඛ්‍යාව;

(v) ලී බඩු අවශ්‍යතා ඇති පාසල් සංඛ්‍යාව; සහ

(vi) ඉහත අඩුපාඩු සහිත පාසල්වල නම්, ලිපිනයන් සහ දුරකථන අංක;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත පාසල්වල පවතින අඩුපාඩු සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කරදීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1026/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2008, 2009 සහ 2010 යන වර්ෂවලදී ශ්‍රී ලංකාවට විදේශ ආයෝජන ලෙස ලැබුණු මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් වර්ෂයේදී ප්‍රමාණවත් විදේශ ආයෝජන ශ්‍රී ලංකාවට ලැබී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1138/'11

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අට්ටාලච්චේනෛ ආලම්කුලම් ප්‍රදේශයේ වර්ෂ ගණනාවක සිට මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර්වරයෙක් නොමැතිකම හේතුවෙන් එහි ජනතාව බොහෝ දුෂ්කරතාවයන් මුහුණ දෙමින් සිටින බවත්;

(ii) පවුල් 300කට අධික සංඛ්‍යාවක් හා 1500කට අධික ජනගහනයක් සිටින ආලම්කුලම් ප්‍රදේශයේ ජනතාව විවාහයක් ලියාපදිංචි කිරීමට සැතපුම් 15ක් දුරින් පිහිටි අට්ටාලච්චේනෛ ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර්වරයා වෙත යා යුතු බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) හදිසියේ සිදුවිය යුතු විවාහයන් ප්‍රමාදයකින් තොරව ලියාපදිංචි කිරීමට හැකිවනසේ ආලම්කුලම් ප්‍රදේශයට මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් කොට්ඨාසයක් ඇති කිරීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0561/'10

ගරු රවී කරුණානායක මහතා,— රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සීමාසහිත "කේ පෝර්ට්" සමාගම විසින් අක්කර 7ක ගොඩනැගිල්ලක් සහ කුළියට දෙන ගොඩනැගිලි 18ක්, රාජ්‍ය ආයතනයකින් බද්දට ලබාගෙන තිබේද;

(ii) ඔවුන් එකඟවූ ගිවිසුම සහ එහි සඳහන් කොන්දේසි කවරේද;

(iii) ආයෝජන මණ්ඩල සහන යටතේ ඉහත සඳහන් ඉඩම සහ දේපල රජය විසින් බදුදීමේ අරමුණ කවරේද;

(iv) ආයෝජන මණ්ඩල සහන පදනම යටතේ මෙම ගනුදෙනුව සිදුකිරීමෙන් රටට හිමිවූ ප්‍රතිලාභය කවරේද;

යන්න එතුමා ප්‍රකාශ කරන්නෙහිද?

(ආ) (i) ඉහත කී බදුදීම සිදු කරන ලද්දේ විධිමත් ටෙන්ඩර් ක්‍රියාපටිපාටිය අනුගමනය කරමින්ද; එසේ නොමැති නම්, රජයේ තක්සේරුකරුවෙකුගේ තක්සේරුවක් අනුවද;

(ii) මෙහිදී නිවැරදි තක්සේරු ක්‍රියාවලිය අනුගමනය නොකිරීමෙන් රජයට සිදුවූ පාඩුව ගණන් බැලීම සඳහා පෞද්ගලික තක්සේරුවක් ලබාගත්තේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) 2004 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා පෞද්ගලික සමාගම්වලට කුළියට දෙන ලද, බදු දෙන ලද හෝ විකුණා දැමූ රාජ්‍ය ආයතන සංඛ්‍යාව එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0824/’10

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, මුලටියන කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, තිහගොඩ කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල යටිතල පහසුකම් සහ පොදු අවශ්‍යතාවයන්ගේ ඌනතාවයන් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) එම පාසල් පද්ධතිය තුළ ඇති;

(i) විදුලිය නොමැති පාසල් සංඛ්‍යාව ;

(ii) පුස්තකාල සහ විද්‍යාගාර පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව ;

(iii) ගුරු නිවාස සංඛ්‍යාව;

(iv) විදුලිය නොමැති ගුරු නිවාස සංඛ්‍යාව;

(v) ලී බඩු අවශ්‍යතා ඇති පාසල් සංඛ්‍යාව; සහ

(vi) ඉහත අඩුපාඩු සහිත පාසල්වල නම්, ලිපිනයන් සහ දුරකථන අංක;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත පාසල්වල පවතින අඩුපාඩු සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කරදීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0859/’10

ගරු අජිත් කුමාර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ගාල්ල බස් නැවතුම්පල ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත වියදම කොපමණද;

(ii) මෙම ඇස්තමේන්තුව සකස්කළ ආයතනය කුමක්ද;

(iii) එම ඇස්තමේන්තුව හා ගොඩනැගිල්ලේ සැලැස්ම කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) මෙම ව්‍යාපෘතියට අදාළ,

(i) කොන්ත්‍රාත්කරු හෝ කොන්ත්‍රාත්කරුවන් කවුරුන්ද;

(ii) උපදේශක සමාගමක් හෝ ආයතනයක් තිබේ නම්, ඒ කවරේද;

(iii) අධීක්ෂණ කටයුතු කරනු ලබන ආයතනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) එම බස්නැවතුම්පලේ ස්වභාවය හා අදාළ ගොඩනැගිල්ල තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන ආයතන හෝ ව්‍යාපාර කවරේද;

(ii) මෙම ගොඩනැගිල්ල තුළ ව්‍යාපාරික ස්ථාන ලබාදීමේදී අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කුමක්ද;

(iii) බස්නැවතුම්පල ඉදිකිරීමට සමගාමීව බස් නැවතුම්පල අවට සහ ගාලු නගරයේ අනිකුත් ප්‍රදේශවලින් ඉවත් කරන ලද පදික වෙළඳුන්ට හා තාවකාලික ව්‍යාපාරික ස්ථාන හිමියන්ට ලබාදෙන සහනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1034/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පැවති යුද්ධය නිසා නැගෙනහිර පළාතේ වැන්දඹුභාවයට පත්වූ කාන්තාවන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම කාන්තාවන් වෙනුවෙන් රජයේ මැදිහත්වීමෙන් ක්‍රියාත්මක වන සුබසාධන ව්‍යාපෘති කවරේද;

(iii) දැනට ක්‍රියාත්මක වන සුබසාධන ව්‍යාපෘති ඉහත සඳහන් වැන්දඹු කාන්තාවන්ට සහන සැලසීම සඳහා ප්‍රමාණවත්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1139/'11

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ, ඉහළ කහගොල්ලාව ගම්මානයට මෙතෙක් විදුලි බලය ලබාදී නොමැති හේතුවෙන් එහි ජනතාව මහත් දුෂ්කරතාවයන්ට මුහුණ දෙන බවත්;

(ii) එම ගම්මානයේ මාර්ගවලට ඉහළින් අධිබලැති ප්‍රධාන විදුලි රැහැන් ගමන් කළද මේ වනතෙක් විදුලිය නොමැතිව අඳුරේ සිටීමට සිදුව ඇති එම ගම්වැසියන් ඉතා අවාසනාවන්ත තත්වයක් යටතේ දිවි ගෙවන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) එසේ නම්, ඉහල කහගොල්ලාව ග්‍රාමයට විදුලි බලය ලබා දීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0562/’10

ගරු රවී කරුණානායක මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට වරාය ව්‍යාපෘතියේ පළමු අදියරේ කොන්ත්‍රාත්කරුවන්ගේ නම් කවරේද;

(ii) එකී කොන්ත්‍රාත්කරුවන් තෝරා ගනු ලැබුවේ ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කිරීමෙන්ද;

(iii) එසේ නම්, එම ටෙන්ඩර්කරුවන්ගේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) හම්බන්තොට වරාය ව්‍යාපෘතියේ දෙවන අදියර ආරම්භ කරන දිනය සහ අවසන් කරන දිනය කවරේද;

(ii) ඒ සඳහා මුදල් සම්පාදනය කරන්නේ කෙසේද;

(iii) පොළිය සහ ඉදිකිරීම් වියදමට අනුව සම්පූර්ණ පිරිවැය කොපමණද;

(iv) ඉදිරි වර්ෂ හය සඳහා වූ මුදල් ප්‍රවාහය පිළිබඳ පුරෝකථනය කවරේද;

(v) ප්‍රාග්ධනය සහ පොළිය සඳහා වන වියදම ද, අනෙකුත් මෙහෙයුම් වියදම් ද, ඉදිරි වර්ෂ දහය තුළ එක් එක් වර්ෂයේ දී ලැබීමට නියමිත ආදායම් ද ඇතුලුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) කොළඹ වරායෙන් ලැබෙන ආදායම හම්බන්තොට වරාය ව්‍යාපෘතිය සඳහා ලබා ගත් ණය ගෙවීම සඳහා යොදා ගන්නේද; සහ

(ii) ණය මුදල ආපසු ගෙවීම ආරම්භවන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0825/’10

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, මුලටියන කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, මුලටියන කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල යටිතල පහසුකම් සහ පොදු අවශ්‍යතාවයන්ගේ ඌනතාවයන් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) එම පාසල් පද්ධතිය තුළ ඇති;

(i) විදුලිය නොමැති පාසල් සංඛ්‍යාව ;

(ii) පුස්තකාල සහ විද්‍යාගාර පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව ;

(iii) ගුරු නිවාස සංඛ්‍යාව;

(iv) විදුලිය නොමැති ගුරු නිවාස සංඛ්‍යාව;

(v) ලී බඩු අවශ්‍යතා ඇති පාසල් සංඛ්‍යාව; සහ

(vi) ඉහත අඩුපාඩු සහිත පාසල්වල නම්, ලිපිනයන් සහ දුරකථන අංක;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත පාසල්වල පවතින අඩුපාඩු සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කරදීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1035/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පැවති යුද්ධය නිසා උතුරු පළාතේ වැන්දඹුභාවයට පත්වූ කාන්තාවන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම කාන්තාවන් වෙනුවෙන් රජයේ මැදිහත්වීමෙන් ක්‍රියාත්මක වන සුබසාධන ව්‍යාපෘති කවරේද;

(iii) දැනට ක්‍රියාත්මක වන සුබසාධන ව්‍යාපෘති ඉහත සඳහන් වැන්දඹු කාන්තාවන්ට සහන සැලසීම සඳහා ප්‍රමාණවත්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1140/'11

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 90,000ක් පමණ වූ ජනතාවක් ජීවත්වන ත්‍රිකුණාමලය කින්නියා ප්‍රදේශයෙහි සංස්කෘතික මධ්‍යස්ථානයක් නොමැතිවීම හේතුවෙන් එහි කලාව හා සාහිත්‍යයට ලැදි අයගේ කලා කුසලතාවන් එළි දැක්වීමට අවස්ථාවක් නොමැතිව සිටින බව එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, ග්‍රන්ථ එළිදැක්වීම, කවි මඩු, විවාද සභා සහ සෙසු කලා වැඩසටහන් ක්‍රියාත්මක කොට ඔවුන්ගේ දක්ෂතාවන් හා පෞරුෂය වර්ධනය කර ගැනීම සඳහා සියලු පහසුකම්වලින් සමන්විත සංස්කෘතික මධ්‍යස්ථානයක් ඉදිකිරීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1144/'11

ගරු අජිත් කුමාර මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2005 සිට 2010 දක්වා කාල සීමාවේදී රැකියා සඳහා විදේශගත වූ ශ්‍රී ලාංකිකයන් අතරින්,

(i) තුවාල ලැබූ (විවිධ අනතුරුවලට භාජනය වූ) සංඛ්‍යාව;

(ii) රැකියා අහිමිව ආපසු පැමිණි සංඛ්‍යාව;

(iii) සුභ සාධක මධ්‍යස්ථානවල සිටින සංඛ්‍යාව;

(iv) වර්ෂ 2005 දී මියගිය සංඛ්‍යාව;

කවරේද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) කොටසහි සඳහන් පීඩාවන්ට පත්වූවන් සඳහා රජය කිසියම් සහන වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළේද;

(ii) එසේ නම්, ඔවුන් වෙනුවෙන් දුන් සහන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2011 ජූනි මස 09 වැනි බ්‍රහස්පතින්දා
# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0479/'10

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ කාර්ය භාරය කවරේද;

(ii) සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් විමර්ශනය කරනු ලැබ ඇති, අභ්‍යන්තරික තැනැත්තන් විසින් සිදු කරන ලද වංචනික ගනුදෙනු සංඛ්‍යාව කොපමණද;

(iii) එම විමර්ශන කටයුතුවලට සම්බන්ධ නම් සහ සිද්ධි කවරේද;

(iv) මේ වන විට එම විමර්ශන කටයුතුවලින් ලැබී ඇති ප්‍රතිඵලය කවරේද;

(v) එම සිද්ධි සමථයකට පත් කොට හෝ ඒ වෙනුවෙන් දඩ මුදල් අය කරනු ලැබ තිබේද;

(vi) අය කරනු ලැබූ දඩ මුදල් ප්‍රමාණයන් සහ එක් එක් පැමිණිල්ල සමථයකට පත් කරනු ලැබූ දිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0632/'10

ගරු අනුර දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යුද්ධයෙන් පසු රැඳවුම් භාරයේ තබාගෙන සිටින එල්.ටී.ටී.ඊ. සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම රැඳවියන්ට අදාළ චෝදනා මේ වන විට ගොනු කර තිබේද;

(iii) ඔවුන් රඳවා තිබෙන කඳවුරු සංඛ්‍යාව කොපමණද;

(iv) එම කඳවුරු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) රැඳවුම් කඳවුරුවල රඳවාගෙන සිටින එල්.ටී.ටී.ඊ. නොවන සැකකරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සැකකරුවන්ගේ නාම ලේඛනයක් සකසා තිබේද;

(iii) එසේ නම්, එම නාමලේඛනය ඉදිරිපත් කරන්නේද;

(iv) එකී සැකකරුවන්ට එරෙහිව චෝදනා ගොනු කර තිබේද;

(v) එම චෝදනා විභාග කරන දිනය කවරේද;

(vi) එම නඩු විභාග පැවැත්වෙන අධිකරණය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම් , ඒ මන්ද?

0804/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, අකුරැස්ස කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, වැලිපිටිය කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල යටිතල පහසුකම් සහ පොදු අවශ්‍යතාවයන්ගේ ඌනතාවයන් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) එම පාසල් පද්ධතිය තුළ ඇති,

(i) විදුලිය නොමැති පාසල් සංඛ්‍යාව;

(ii) පුස්තකාල සහ විද්‍යාගාර පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව ;

(iii) ගුරු නිවාස සංඛ්‍යාව;

(iv) විදුලිය නොමැති ගුරු නිවාස සංඛ්‍යාව;

(v) ලී බඩු අවශ්‍යතා ඇති පාසල් සංඛ්‍යාව; සහ

(vi) ඉහත අඩුපාඩු සහිත පාසල්වල නම්, ලිපිනයන් සහ දුරකථන අංක;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත පාසල්වල පවතින අඩුපාඩු සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කරදීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0999/'10

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ලෝකයේ වාරි හා කෘෂි ශිෂ්ඨාචාරය අනුව ශ්‍රී ලංකාවට ඉතා වැදගත් තැනක් හිමිවන හෙයින් එම තත්ත්වය මතු පරපුරට දායාද කිරීමට හැකිවන පරිදි ජල හා වාරි කෞතුකාගාරයක් ඉදිකිරීම සුදුසු බවත්;

(ii) එමගින් ලාංකීය කෘෂි හා වාරි කර්මාන්ත ඉතිහාසය පිළිබඳව අනාගත පරපුරට අධ්‍යයනය කිරීමට අවස්ථාව සැලසෙන බවත්;

(iii) එවැනි කෞතුකාගාරයක් ඉදිකිරීම මගින් වාරි හා කෘෂි ක්ෂේත්‍රයේ නියැලී සිටින අයට පර්යේෂණ කිරීමට අවස්ථාවක් සැළසෙන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) එසේ නම්, එවැනි කෞතුකාගාරයක් ඉදිකිරීම කඩිනමින් ආරම්භ කිරීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1025/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2007, 2008, 2009 සහ 2010 යන වර්ෂවලදී වාර්තාවූ රැකියා විරහිත උපාධිධාරීන්ගේ සංඛ්‍යාවන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) උපාධිධාරීන්ගේ රැකියා ප්‍රශ්නය විසඳීම උදෙසා රජය ගන්නා වූ ක්‍රියාමාර්ගයන් කවරේද;

(iii) එම පියවර උපාධිධාරීන්ගේ රැකියා ප්‍රශ්නය විසඳීම සඳහා ප්‍රමාණවත්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1047/'10

ගරු මොහමඩ් අස්ලම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) දිවයිනේ විවිධ පළාත්වල සේවය කරන ස්වේච්ඡා ගුරුවරුන්, ගුරු සහයකවරුන් ලෙස පත්කිරීම සම්බන්ධයෙන් 2006.10.25 දින අමාත්‍ය මණ්ඩලය එළැඹී තීන්දුවකට අනුව සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක ED/2/20/4/1/47උප හා 2007.02.10 දිනැති උපදෙස් අනුව, මධ්‍යම පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් අයදුම්පත් කැඳවන ලද බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඒ අනුව මධ්‍යම පළාත තුළ ගුරු සහායක තනතුර සඳහා අයදුම්කළ සංඛ්‍යාව කොපමණද;

(ii) සම්මුඛ පරීක්ෂණයෙන් එම තනතුර සඳහා සුදුසුකම්ලත් පුද්ගලයින්ගේ සංඛ්‍යාව කොපමණද;

(iii) ඔවුන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iv) ඔවුන් අතුරින් මේ වන විටත් ඉහත පත්වීම් ලද පුද්ගලයින්ගේ සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ ලිපිනයන් මහනුවර, මාතලේ, නුවරඑළිය යන දිස්ත්‍රික්කවලට අයත් අධ්‍යාපන කලාප මට්ටමින් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0770/'10

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2009 හා 2010 යන වර්ෂවලදී,

(i) මත්පැන් බලපත්‍ර නිකුත්කර තිබේද;

(ii) එසේ නම්, විවිධ කාණ්ඩ යටතේ නිකුත් කොට ඇති බලපත්‍ර සංඛ්‍යාව කවරේද;

(iii) නිකුත් කරන ලද නව බලපත්‍ර සංඛ්‍යාව දිස්ත්‍රික් පදනමින් කවරේද;

(iv) මත්පැන් බලපත්‍ර නිකුත් කිරීමෙන් උපයාගත් ආදායම කොපමණද;

(v) එම බලපත්‍රවලින් කිසිවක් අවලංගු කොට තිබේද;

(vi) එසේ නම්, එලෙස අවලංගු කරන ලද මත්පැන් බලපත්‍ර කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0826/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, මුලටියන කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, හක්මණ කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල යටිතල පහසුකම් සහ පොදු අවශ්‍යතාවයන්ගේ ඌනතාවයන් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) එම පාසල් පද්ධතිය තුළ ඇති,

(i) විදුලිය නොමැති පාසල් සංඛ්‍යාව;

(ii) පුස්තකාල සහ විද්‍යාගාර පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව;

(iii) ගුරු නිවාස සංඛ්‍යාව;

(iv) විදුලිය නොමැති ගුරු නිවාස සංඛ්‍යාව;

(v) ලී බඩු අවශ්‍යතා ඇති පාසල් සංඛ්‍යාව;

(vi) ඉහත අඩුපාඩු සහිත පාසල්වල නම්, ලිපිනයන් සහ දුරකථන අංක;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) ඉහත පාසල්වල පවතින අඩුපාඩු සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කරදීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1029/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 අවසන් වන විට ශ්‍රී ලංකාවේ සිටි සමස්ත ගර්භණී මව්වරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) රජයේ මැදිහත්වීමෙන් ගර්භණී මව්වරුන්ට පෝෂණ සලාක ලබා දීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, පෝෂණ සලාක ලබාදෙන මව්වරුන් සංඛ්‍යාව කොපමණද;

(iv) ගර්භනී මව්වරුන්ට පෝෂණ සලාක ලබා දෙන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කවරේද;

(v) එසේ ලබා දෙන පෝෂණ සලාකය ගැබිණි මව්වරුන්ගේ පෝෂණ අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රමාණවත්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1048/'10

ගරු මොහමඩ් අස්ලම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ස්වේච්ඡා ගුරුවරුන්, ගුරු සහයකවරුන් ලෙස පත්කිරීමට අදාළ 2006.10.25 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය සහ අධ්‍යාපන අමාත්‍යංශයේ අංක ED/2/20/4/1/47 උප දරන 2007.02.10 දිනැති ලිපිය මගින් නිකුත් කරන ලද උපදෙස් අනුව, මධ්‍යම පළාත් අධ්‍යාපන අමාත්‍යංශය මගින් කළ අයදුම්පත් කැඳවීම පරිදි මාතලේ දිස්ත්‍රික්කයේ නාඋල , විල්ගමුව, ගලේවෙල හා මාතලේ යන අධ්‍යාපන කලාපවලින් ඉදිරිපත් වූ අපේක්ෂකයින් අතරින් 31 දෙනෙකු සම්මුඛ පරීක්ෂණයේදී එම තනතුර සඳහා සුදුසුකම් ලද බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) අධ්‍යාපන අමාත්‍යංශ ලේකම්ගේ අංක ED/2/29/4/1/47 List හා 2008.09.08 දිනැති ලිපිය මගින් ඔවුන්ට ගුරු සහායක පත්වීම් පිරිනමන ලෙසට මධ්‍යම පළාත් අධ්‍යාපන ලේකම් වෙත නියෝග කර ඇති බවත්;

(ii) මෙතෙක් එම පත්වීම් ලබාදීම වෙනුවට 2010.02.10 දින ගුරු පුහුණුව සඳහා නියමිත මධ්‍යස්ථාන සඳහා අනුයුක්ත කරමින් අධ්‍යාපන ලේකම් විසින් අංක (ED/1/20/6/24) යටතේ ලිපි යැවීම පමණක් සිදුකර ඇති බවත්;

(iii) එම තත්වය නිසා ගුරු සහායක පත්වීම් ලැබීමට නියමිත ඉහත පිරිස තවදුරටත් අසරණභාවයට පත්වී සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) එසේ නම්, ඔවුන්ට ගුරු සහායක පත්වීම් ලබාදීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1137/'11

ගරු අනුර දිසානායක මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොරටුව මහ නගර සභා බල ප්‍රදේශයේ, ඉඩම, පීරිස් මාවතේ, යූ. සී. ලෑන්ඩ් (U.C. Land) නමින් තිබෙන පිඹුරු අංක 515 A දරන, හෙක්ටයාර් 0.64516 ක වපසරියකින් යුත් ඉඩම, ඉඩම් කොටස් 44කට බෙදා ඉඩම්ලාභීන්ට ලබා දී ඇති බවත්;

(ii) එම ඉඩම්ලාභීන්ට නිරවුල් ඔප්පු නොලැබීම සම්බන්ධයෙන්, 2009 සැප්තැම්බර් 24 දින එවකට පළාත් පාලන අමාත්‍යතුමාගෙන් පාර්ලිමේන්තුවේදී වාචික ප්‍රශ්නයක් අසන ලද බවත්;

(iii) ඊට පිළිතුරු වශයෙන් අදාළ ඔප්පු ලබාදීමට ඒ වනවිටත් කටයුතු සිදු ෙකරෙමින් පවතින බව සඳහන් කර ඇති බවත්;

(iv) එසේ වුවද මෙතෙක් එම ඉඩම් සඳහා නිරවුල් ඔප්පු ලබාදීමට කටයුතු කර නොමැති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) ඉහත ඉඩම්ලාභීන් හට කඩිනමින් නිරවුල් ඔප්පු ලබාදීමට අවශ්‍ය පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0771/'10

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ කටයුතු වෙනුවෙන් මුදල් සැපයීම සඳහා පසුගිය වර්ෂ 6 තුල රජය මුදල් ණයට ලබාගෙන තිබේද;

(ii) 2011, 2012, 2013, 2014 හා 2015 යන වර්ෂවලට අදාළව ප්‍රක්ෂේපිත සමස්ථ ණය ආපසු ගෙවීමේ ප්‍රමාණය ප්‍රාග්ධන හා පොළී පිරිවැය වශයෙන් කොපමණද;

(iii) 2003, 2004 හා 2005 යන වර්ෂවල සමස්ථ ණය ආපසු ගෙවීමේ ප්‍රමාණය ප්‍රාග්ධන හා පොළී පිරිවැය වශයෙන් කොපමණද;

(iv) 2008, 2009 හා 2010 යන වර්ෂවල ගෙවුම් ශේෂ හිඟය කොපමණද;

(v) 2011, 2012, 2013 හා 2014 යන වර්ෂ සඳහා ගණන් බලා ඇති ගෙවුම් ශේෂ හිඟය හෝ ප්‍රමාණයන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0929/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ, 375/B, සහබන්දු කොක්මාදුව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි දෙල්ගහවල ජලාශය යටතේ අස්වද්දනු ලබන කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම ජලාශය අක්කර හතක (07) පමණ වපසරියකින් යුක්ත වර්ෂ සියයක් (100) පමණ පැරණි ජලාශයක් බවත්;

(ii) වර්ෂ 10 ක පමණ කාලයක සිට පුද්ගලයින් දෙදෙනෙකු විසින් එම වැවට හිමිකම් කියාපෑම නිසා කුඹුරු ඉඩම්වලට ජලය ලබා ගැනීමට බාධා ඇති වී තිබෙන බවත්;

(iii) මේ වන විට එය වල් බිහිවී කුඹුරු ඉඩම්වලට ජලය ලබා ගැනීමට නොහැකි තත්වයකට පත්ව ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) එම ජලාශය නැවත රජයට පවරා ගෙන හෝ ප්‍රතිසංස්කරණය කොට කුඹුරු ඉඩම් වගා කිරීමට අවශ්‍ය ජලය ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1031/’10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 අවසන් වන විට ශ්‍රී ලංකාවේ වතුකරයේ මන්ද පෝෂණයෙන් පෙළුණු ළදරු ප්‍රතිශතය කවරේද;

(ii) එම තත්වයන් මඟහැරවීම සඳහා රජය ගන්නා වූ පියවර කවරේද;

(iii) රජය විසින් ගනු ලබන එම ක්‍රියාමාර්ග එම ළදරුවන්ගේ පෝෂණ තත්වය නංවාලීම සඳහා ප්‍රමාණවත්ද:

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1168/’11

ගරු අනුර දිසානායක මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බිත්තර හා කුකුළු මස් මිල ඉහළ යාමේ අර්බුදය හමුවේ පිටරටින් ගෙන්වන ලද බිත්තර හා කුකුළු මස් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) පිටරටින් එක් බිත්තරයක් ගෙන්වීමේදී මිලදී ගැනීමේ පිරිවැය, වරාය ගාස්තු හා ප්‍රවාහන ගාස්තු වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඒ අනුව ලංකාවට ගෙන්වන ලද බිත්තරයක මිල හා එම බිත්තරයක් වෙළඳ පොලේදී විකුණු මිල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2011 ජූනි මස 10 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0581/’10

ගරු රවී කරුණානායක මහතා,— සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පසුගිය වර්ෂ 5 තුළ එක් එක් වර්ෂයේදී සංස්කෘතික ත්‍රිකෝණයට අයත් ප්‍රදේශයේ සංචාරය කිරීමට පැමිණි සංචාරකයින් සංඛ්‍යාව කවරේද;

(ii) සංස්කෘතික ත්‍රිකෝණයට අයත් ප්‍රදේශයේ පිහිටි ඓතිහාසික ස්ථානවලින් උපයන ලද විදේශ විනිමය ප්‍රමාණය කවරේද;

(iii) බෞද්ධාගම ප්‍රවර්ධනය කිරීම සහ සංචාරක වෙළෙඳපොළ ආකර්ශනය කර ගැනීම සඳහා සංස්කෘතික ත්‍රිකෝණය ප්‍රයෝජනයට නොගන්නේ කවර හේතු නිසාද;

(iv) දැනටමත් එසේ ප්‍රයෝජනයට ගෙන තිබේ නම්, ඒ සම්බන්ධයෙන් ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) බෞද්ධ සංචාරකයෙකුට නැරඹීම සඳහා උනන්දුවක් ඇතිකරවන සුළු ශ්‍රී ලංකාව තුළ පිහිටි වෙනත් ඓතිහාසික ස්ථාන පහක නම් කවරේද;

(ii) ඓතිහාසික වශයෙන් වැදගත් ස්ථාන නගා සිටුවීම සහ සුරැකීම සඳහා ඉහත ක්‍රියාවලිය තුළින් උපයාගත් මුදල් රජය බෞද්ධ ආගමික ස්ථානවලට ලබා දෙන්නේද;

(iii) එසේ නම්, පසුගිය වර්ෂය තුළ එසේ මුදල් ලැබූ බෞද්ධ ආගමික ස්ථාන හෝ වෙනත් ස්ථානයන් කවරේද සහ එම එක් එක් ස්ථානයට ලැබුනු මුදල් ප්‍රමාණය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0930/’10

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, මාතර කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, මාතර කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් අතරින්,

(i) සනීපාරක්ෂක පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව, එම පාසල්වල නම් සහ ලිපිනයන් කවරේද;

(ii) ගොඩනැගිලි අවශ්‍යතා ඇති පාසල්වල නම් සහ අවශ්‍ය ගොඩනැගිලි සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත අවශ්‍යතාවයන් සපුරාලීම මඟින් මෙම පාසල්වල අධ්‍යාපනයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක සංවර්ධනයක් ඇති වන බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) එසේ නම්, එම අවශ්‍යතාවයන් සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන එම පාසල් සඳහා ලබාදීමට කටයුතු කරන්නේද;

(ii) ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1007/’10

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) රජයේ පාසල් පද්ධතිය තුළ සිටින වැඩ බලන විදුහල්පතිවරුගේ සංඛ්‍යාව කොපමණද:

(ii) වැඩ බලන විදුහල්පතිවරු සිටින පාසල්වල විදුහල්පතීන් ලෙස සේවය කිරීම සඳහා සුදුසුකම් ඇති, අධ්‍යාපන පරිපාලන සේවා විභාගය සමත්ව සිටින සංඛ්‍යාව කොපමණද;

(iii) ඊට අමතරව ඉහත පාසල්වල විදුහල්පති තනතුරු දැරීමට සුදුසුකම් ඇති, විදුහල්පති ශ්‍රේණීන් සමත්ව සිටින විදුහල්පතිවරුන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම විදුලහල්පතිවරු එම තනතුරු සඳහා පත් නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දිවයින තුළ ඇති ඉසුරු පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) නවෝදා පාසැල් සංඛ්‍යාව කොපමණද;

(iii) එම පාසල් සඳහා පසුගිය වර්ෂ පහ තුළ වෙන්කර ඇති මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) වයඹ පළාත් සභාව යටතේ පාලනය වන පාසල්වලට බඳවාගෙන ඇති සේවක සංඛ්‍යාව එක් එක් තනතුරු අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) සේවකයින් බඳවාගත් පාසල් කවරේද;

(iii) එම සේවකයින් බඳවා ගැනීමේ ක්‍රමවේදය කවරේද:

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1038/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වන විට ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල අධ්‍යාපනය හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට අධ්‍යාපනය ප්‍රගුණ කිරීම සඳහා ලබා දෙන සහන කවරේද;

(ii) එම සහනයන් ලබන සිසුන් සංඛ්‍යාව කොපමණද;

(iii) දැනට ශිෂ්‍යාධාර ලබා දෙන සිසුන් සංඛ්‍යාව කවරේද;

(iv) ලබා දෙන ශිෂ්‍යාධාරය සිසුන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා ප්‍රමාණවත්ද;

(v) ප්‍රමාණවත් නොවන්නේ නම්, ඊට හේතු කවරේද?

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1049/'10

ගරු මොහමඩ් අස්ලම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ස්වේච්ඡා ගුරුවරුන්, ගුරු සහයකවරුන් ලෙස පත්කිරීමට අදාළ 2006.10.25 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක ED/2/20/4/1/47 උප දරන 2007.02.10 දිනැති ලිපිය මගින් නිකුත් කරන ලද උපදෙස් අනුව, මධ්‍යම පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් කළ අයදුම්පත් කැඳවීම පරිදි නුවරඑළිය දිස්ත්‍රික්කයේ වලපනේ, නුවරඑළිය, හඟුරන්කෙත, කොත්මලේ හා හැටන් යන අධ්‍යාපන කලාපවලින් ඉදිරිපත් වූ අපේක්ෂකයින් අතරින් 50 දෙනෙකු සම්මුඛ පරීක්ෂණයේදී එම තනතුර සඳහා සුදුසුකම් ලද බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) අධ්‍යාපන අමාත්‍යංශ ලේකම්ගේ අංක ED/2/29/4/1/47 List හා 2008.09.08 දිනැති ලිපිය මගින් ඔවුන්ට ගුරු සහායක පත්වීම් පිරිනමන ලෙසට මධ්‍යම පළාත් අධ්‍යාපන ලේකම් වෙත නියෝග කර ඇති බවත්;

(ii) මෙතෙක් එම පත්වීම් ලබාදීම වෙනුවට 2010.02.10 දින ගුරු පුහුණුව සඳහා නියමිත මධ්‍යස්ථාන සඳහා අනුයුක්ත කරමින් අධ්‍යාපන ලේකම් විසින් අංක ED/1/20/6/24 යටතේ ලිපි යැවීම පමණක් සිදුකර ඇති බවත්;

(iii) එම තත්වය නිසා ගුරු සහායක පත්වීම් ලැබීමට නියමිත ඉහත පිරිස තවදුරටත් අසරණභාවයට පත්වී සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) එසේනම්, ඔවුන්ට ගුරු සහායක පත්වීම් ලබාදීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1145/'11

ගරු අජිත් කුමාර මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2005 සිට 2010 ඔක්තෝබර් දක්වා දකුණු කොරියාව වෙත ගිය ශ්‍රී ලාංකිකයන් සංඛ්‍යාව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම පිරිස අතරින් පුහුණු ශ්‍රමිකයින් සහ නුපුහුණු ශ්‍රමිකයින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන්, දිස්ත්‍රික් මට්ටමින් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) දකුණු කොරියාවේ රැකියාවකට යවනු ලබන එක් පුද්ගලයෙකුගේ ගුවන් ටිකට් පතක වටිනාකම කොපමණද;

(ii) එම වටිනාකමින් එක් පුද්ගලයෙකුගෙන් අය කළ මුදල කොපමණද;

(iii) රජය මගින් ලබාදුන් කොටස කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0658/'10

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රටේ මූල්‍ය කටයුතු සහ රෙගුලාසි අධීක්ෂණය කරනු ලබන රාජ්‍ය ආයතනය කවරේද;

(ii) ශ්‍රී ලංකා මහ බැංකුව ආරම්භ කරන ලද්දේ කවදාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2005 සිට මේ දක්වා බංකොලොත්භාවයට පත්ව ඇති මූල්‍ය සමාගම්හි බංකොලොත්භාවයට හේතු වූ කාරණා කවරේද;

(ii) ඉහත කී මූල්‍ය සමාගම් අයහපත් ආකාරයකින් පවත්වාගෙන යමින් තිබියදී ඒ සම්බන්ධයෙන් මහ බැංකුවේ අධීක්ෂණ ඒකකය විසින් ගනු ලැබූ පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) අසාර්ථක වූ මූල්‍ය සමාගම් විසින් ගෙවීම් පැහැර හරිනු ලැබ ඇති සම්පූර්ණ මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) මුදල් ආපසු ගෙවනු ලැබූ තැන්පත්කරුවන්ගේ සංඛ්‍යාව කවරේද;

(iii) ඔවුන්ට ගෙවන ලද මුදල් ප්‍රමාණය කොපමණද;

(iv) ඉහත කී කාල පරිච්ඡේදය තුළ මහ බැංකුවේ අධිපති ධූරය දැරූ තැනැත්තාගේ නම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0931/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) දකුණු පළාතේ පාසල්වල මේ වන විට වර්ෂ 10 කට ආසන්න කාලයක් ස්වේච්ඡා පදනම මත සේවයේ නියුක්ත ගුරු පිරිසක් කිසිදු දීමනාවක් නොලබා සේවය කරනු ලබන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එලෙස සේවය කරනු ලබන ගුරුවරුන්ගේ නම් සහ සංඛ්‍යාව අධ්‍යාපන කලාප මට්ටමින්, වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම ගුරුවරුන් බඳවාගනු ලැබුවේ කවර විෂයයන් ඉගැන්වීම සඳහාද;

(iii) ඔවුන් බඳවාගත් ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) දිවයිනේ වෙනත් පළාත්වල සේවය කරන ලද ස්වේච්ඡා ගුරුවරුන් ගුරු සේවයට අන්තර්ග්‍රහණය කර ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) (i) එසේ නම්, දකුණු පළාතේ ස්වේච්ඡා ගුරුවරුන් ගුරු සේවයට අන්තර්ග්‍රහණය කිරීම සඳහා කටයුතු කරන්නේද;

(ii) ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1039/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 දෙසැම්බර් වන විට ශ්‍රී ලංකාවේ සිටි දිළිඳුබවෙන් පෙළෙන පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම දුප්පත් පවුල් සංඛ්‍යාව ජනගහනයෙන් කවර ප්‍රතිශතයක්ද;

(iii) දුප්පත්කම ගණනය කිරීමේදී අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(iv) එම ක්‍රමවේදය මඟින් සිදුකරනු ලබන ගණනය කිරීම් නිවැරදිවේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1050/'10

ගරු මොහමඩ් අස්ලම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ස්වේච්ඡා ගුරුවරුන්, ගුරු සහයකවරුන් ලෙස පත්කිරීමට අදාළ 2006.10.25 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක ED/2/20/4/1/47 උප දරන 2007.02.10 දිනැති ලිපිය මගින් නිකුත් කරන ලද උපදෙස් අනුව, මධ්‍යම පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් කළ අයදුම්පත් කැඳවීම පරිදි මහනුවර දිස්ත්‍රික්කයේ කටුගස්තොට, ගම්පොල, තෙල්දෙනිය, වත්තේගම, දෙනුවර සහ මහනුවර යන අධ්‍යාපන කලාපවලින් ඉදිරිපත් වූ අපේක්ෂකයින් අතරින් 61 දෙනෙකු සම්මුඛ පරීක්ෂණයේදී එම තනතුර සඳහා සුදුසුකම් ලද බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අංක ED/2/29/4/1/47 List හා 2008.09.08 දිනැති ලිපිය මගින් ඔවුන්ට ගුරු සහායක පත්වීම් පිරිනමන ලෙසට මධ්‍යම පළාත් අධ්‍යාපන ලේකම් වෙත නියෝග කර ඇති බවත්;

(ii) මෙතෙක් එම පත්වීම් ලබාදීම වෙනුවට 2010.02.10 දින ගුරු පුහුණුව සඳහා නියමිත මධ්‍යස්ථාන සඳහා අනුයුක්ත කරමින් අධ්‍යාපන ලේකම් විසින් අංක ED/1/20/6/24 යටතේ ලිපි යැවීම පමණක් සිදුකර ඇති බවත්;

(iii) එම තත්වය නිසා ගුරු සහායක පත්වීම් ලැබීමට නියමිත ඉහත පිරිස තවදුරටත් අසරණභාවයට පත්වී සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) එසේ නම්, ඔවුන්ට ගුරු සහායක පත්වීම් ලබාදීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1146/'11

ගරු අජිත් කුමාර මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2005 සිට 2010 ඔක්තෝබර් දක්වා සයිප්‍රසයට ගිය ශ්‍රී ලාංකිකයන් සංඛ්‍යාව වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම පිරිස අතරින් පුහුණු ශ්‍රමිකයින් සහ නුපුහුණු ශ්‍රමිකයින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන්, දිස්ත්‍රික් මට්ටමින් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) සයිප්‍රසයේ රැකියාවකට යවනු ලබන එක් පුද්ගලයෙකුගේ ගුවන් ටිකට් පතක වටිනාකම කොපමණද;

(ii) එම වටිනාකමින් එක් පුද්ගලයකුගෙන් අය කළ මුදල කොපමණද;

(iii) රජය ලබාදුන් කොටස කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0690/'10

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සීමාසහිත රක්නා ආරක්ෂන ලංකා සමාගම සංස්ථාපිත කරනු ලැබුයේ කවදාද;

(ii) එම සමාගමේ කොටස්කරුවන් සහ අධ්‍යක්ෂවරුන්ගේ නම් කවරේද;

(iii) ඉහත කී සමාගම ආරක්ෂක සේවා සපයන රාජ්‍ය ආයතනවල නම් කවරේද;

(iv) එම රාජ්‍ය ආයතන සඳහා ආරක්ෂාව සැපයීම සඳහා වූ කොන්ත්‍රාත් පිරිනමා ඇත්තේ නිසි ටෙන්ඩර් පරිපාටිය අනුවද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) සීමාසහිත රක්නා ආරක්ෂන ලංකා සමාගම එක් ආරක්ෂක නිලධාරියෙකු සඳහා අය කරන ගාස්තු ප්‍රමාණය කොපමණද;

(ii) ආරක්ෂක සේවා සැපයුම් අංශයේ මෙම වෙනස සිදුවීමට පෙර, ආරක්ෂක සේවා සැපයූ පෞද්ගලික අංශයේ සමාගම් අය කළ මුදල කොපමණද;

(iii) සීමාසහිත රක්නා ආරක්ෂන ලංකා සමාගමේ ආරක්ෂක නිලධාරියෙකුට හිමි දෛනික සහ මාසික ගෙවීම් සහ අනෙකුත් ප්‍රතිලාභ කවරේද;

(iv) පසුගිය වර්ෂ 3 සඳහා මෙම සමාගමේ ලාභ - අලාභ ගිණුම් වාර්ෂික පදනමින් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0932/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ තිබෙන ලියාපදිංචි පෙර පාසල් සංඛ්‍යාව, ඒවායේ නම් සහ ලිපිනයන් එක් එක් පළාත් පාලන ආයතනය අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම පෙර පාසල්වල පාලිකාවන්ගේ නම් සහ පෞද්ගලික ලිපිනයන් කවරේද;

(iii) එම පෙර පාසල් පාලිකාවන්ට වැටුපක් ලබා දීමට වර්තමාන රජය කටයුතු කරන්නේද;

(iv) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1040/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ දුප්පත්කම තුරන් කිරීම වෙනුවෙන් රජය ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(ii) එම ක්‍රියාමාර්ගය හරහා ආවරණය වන පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) දුප්පත්කම තුරන් කිරීමේ ඉලක්ක වර්තමාන රජයේ වැඩසටහන් තුළින් සාර්ථකව සපුරාගෙන තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1149/'11

ගරු අජිත් කුමාර මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2005 සිට 2010 දක්වා කාල සීමාවේදී විදේශ රැකියා නියෝජිත ආයතනයක් ලියාපදිංචි කිරීම සඳහා රජය අය කරන ලද ගාස්තුව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) විවිධ අක්‍රමිකතා සඳහා යොමු වී ඇති විදේශ රැකියා ඒජන්සි තිබේද;

(ii) ඒවා නීතිය හමුවට ගෙනැවිත් තිබේද;

(iii) එවැනි ආයතන සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

පා. 6/'10

ගරු රවී කරුණානායක මහතා,— පොලිතින්, ප්ලාස්ටික් ආදී අපද්‍රව්‍ය ඉවත් කිරීම පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා දීප ව්‍යාප්ත වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම,— දිවයිනේ පොලිතින් හා ප්ලාස්ටික් ද්‍රව්‍ය භාවිතය සීඝ්‍රයෙන් වැඩි වී ඇති අතර, ඒවා අනිසි ලෙස බැහැර කිරීමෙන් මහා පරිමාණයෙන් පරිසර දූෂණය සිදුවන බැවින් එවැනි අපද්‍රව්‍ය ඉවත් කිරීම පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා දීප ව්‍යාප්ත වැඩ සටහනක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 7/'10

ගරු රවී කරුණානායක මහතා,— රාජ්‍ය බැංකු වලින් ලබා ගත් ණය පැහැරහරින්නන්ගේ නම් ප්‍රසිද්ධියට පත් කිරීම,— රාජ්‍ය බැංකුවලින් රුපියල් මිලියන 100 කට අධික ණය ලබා ගෙන ආපසු ගෙවීම පැහැරහරින්නන්ගේ නම් ප්‍රසිද්ධියට පත් කිරීම සඳහා නීති සම්පාදනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 8/'10

ගරු රවී කරුණානායක මහතා,— පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනා ක්‍රියාත්මක කිරීම,— පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනා ඵලදායී ක්‍රමයක් වන අයුරින්, ඒවා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබීමෙන් පසු වසරක් තුල විවාදයට භාජනය කළ යුතු බවත්, ඒවා සභා සම්මත වුවහොත්, හය මාසයක් තුළ අමාත්‍ය මණ්ඩලය විසින් ද අනුමත කළ යුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 9/'10

ගරු රවී කරුණානායක මහතා,— පාර්ලිමේන්තුව තුළ ජාතික ගීය වාදනය කිරීම,— දිවයින තුළ ජාතික මමත්වයක් වර්ධනය කිරීමට හැකිවනු වස් පාර්ලිමේන්තුවේ රැස්වීම ආරම්භ කිරීමට හා අවසාන කිරීමට පෙරාතුව පාර්ලිමේන්තුව තුළ ජාතික ගීය වාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 10/'10

ගරු රවී කරුණානායක මහතා,— බලගතු ශ්‍රී ලාංකික අනන්‍යතාවයක් ගොඩනැගීම,— ආණ්ඩුවේ ලිපිලේඛනාදියෙහි යම් කෙනෙකුගේ ජාතිය හා ආගම සඳහන් කිරීම අවශ්‍ය කරුණක් වීම බලගතු ශ්‍රී ලාංකික අනන්‍යතාවයක් ගොඩනැගීමට බාධාවක් හා අවහිරයක් වී ඇති බැවින් එම අවශ්‍යතාවය ඉවත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 11/'10

ගරු රවී කරුණානායක මහතා,— වාණිජ අරමුණු සඳහා ආගමික නායකයින්ගේ රූප භාවිතා කිරීම වැළැක්වීම,— සියලුම ආගම්වලට සමානව ගරු කළ යුතු අතර කිසිදු වෙළෙඳ දැන්වීමක හෝ වෙනත් ආගමික නොවන භාණ්ඩයක බුදුරජාණන් වහන්සේගේ, ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ, ශිව දෙවියන්ගේ සහ මහම්මත් නබිතුමන්ගේ රූප ඇතුලත් නොකළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 12/'10

ගරු රවී කරුණානායක මහතා,— අධිකරණයට අපහාස කිරීම පිළිබඳ කාර්ය පටිපාටිය විධිමත් කිරීමට නව නීති සකස් කිරීම,— සියලු දෙනාටම සමාන සාධාරණත්වයක් සහතික කරනු වස් ශක්තිමත් ප්‍රජාතන්ත්‍රවාදයක් සහ උද්දීප්තිමත් නිදහස් මාධ්‍යයක් පවත්වාගෙන යාම සඳහා අධිකරණයට අපහාස කිරීම පිළිබඳ කාර්ය පටිපාටිය විධිමත් කිරීමට නව නීති සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 13/'10

ගරු රවී කරුණානායක මහතා,— මහජන යහපත උදෙසා නඩුකරණයට නීති හඳුන්වාදීම,— දිළිඳු ජනතාවගේ මූලික මිනිස් අයිතිවාසිකම් කඩවීම, රාජ්‍ය ප්‍රතිපත්ති වල අඩංගු දේ හෝ ඒවායේ බලපෑම, පොදු කටයුතු ඉටු කිරීමට නාගරික අධිකාරයන්ට බලපෑම් කිරීම, ආගමික අයිතිවාසිකම් හෝ අනෙකුත් මූලික අයිතිවාසිකම් කඩවීම සහ අධික මහජන ණය හා පුරවැසියන් අතිරේක වගකීම් වලට යොමු කැරෙන දූෂණය යන කරුණු සම්බන්ධයෙන් මහජන යහපත උදෙසා නඩුකරණයට නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 14/'10

ගරු රවී කරුණානායක මහතා,— දේශපාලන පක්ෂ විසින් මැතිවරණ කොමිෂන් සභාවට මූල්‍ය විගණන වාර්තාවක් ඉදිරිපත් කිරීම,— සියලුම පිළිගත් දේශපාලන පක්ෂ විසින් උපයාගත් ආදායම් හා දැරූ වියදම් විගණනයට භාජනය කළ යුතු හා මැතිවරණ කොමිෂන් සභාවට ඉදිරිපත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 15/'10

ගරු රවී කරුණානායක මහතා,— රාජ්‍ය නිලධාරීන්ට දඬුවම් පැමිණවීම,— රජයේ උසස් නිලධරයන් තම ස්වාධීන නිලය දේශපාලනීකරණය කරන්නේ නම් හා අයථා ලෙස යොදා ගන්නේ නම්, එයින් වැරදිකරුවන් බව ඔප්පු වූ වහාම ඔවුන්ට දඬුවම් පැමිණවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 16/'10

ගරු රවී කරුණානායක මහතා,— විශ්‍රාම ගැන්වීමේ වයස් සීමාව දීර්ඝ කිරීම,— රාජ්‍ය නිලධාරීන්ගේ විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 65 දක්වා වැඩි කළ යුතු යැයිද, ව්‍යවස්ථාදායකය විසින් නිර්දේශ කරනු ලැබුවහොත් විශේෂ කුසලතා ඇති නිලධාරීන් සඳහා එය අවුරුදු 70 දක්වා දීර්ඝ කළ හැකි යැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 17/'10

ගරු රවී කරුණානායක මහතා,— අධ්‍යාපනය ආරක්ෂා කිරීම සඳහා තත්ත්ව ආරක්ෂණ සභාවක් ස්ථාපිත කිරීම,— වගකීමකින් තොරව විශ්වවිද්‍යාල නාමයන් භාවිත කරමින් ශ්‍රී ලංකාව තුළ විශාල වශයෙන් අධ්‍යාපනික ආයතන බිහිවෙමින් පවතින නිසා, අධ්‍යාපනය අනාගත පරම්පරාව සඳහා ආරක්ෂා කර දීම උදෙසා "තත්ත්ව ආරක්ෂණ සභාවක්" නීතිමය වශයෙන් වහා ස්ථාපිත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 18/'10

ගරු රවී කරුණානායක මහතා,— "විශේෂ නඩු පවරන නිලධාරී" නමැති තනතුරක් ඇති කිරීම,— රාජ්‍ය සේවය දේශපාලන බලපෑම් වලින් තොර බවට සහතික කරනු වස්, ආයතනවල ගුණාත්මකභාවයට බලපාන ලෙස සිදු කළ අයථා පරිහරණයන්, දූෂණයන් හෝ අකාර්යක්ෂමතාවයන් පිළිබඳ සිද්ධීන්, ස්වාධීන කොමිසම්, රාජ්‍ය ගිණුම් කාරක සභාව සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව මගින් වාර්තා කළ වහාම ඒ සම්බන්ධ පැමිණිලි මෙහෙයවන, පාර්ලිමේන්තුවට සෘජුවම වාර්තා කරනු ලබන තනතුරක්, "විශේෂ නඩු පවරන නිලධාරී" නමින් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 19/'10

ගරු රවී කරුණානායක මහතා,— අයවැය සම්මත කිරීමට පෙර පූර්ව අයවැය විවාදයක් පැවැත්වීම,—ඉන්දියාව හා එක්සත් රාජධානිය මෙන් අවසාන හා පූර්ණ අයවැය සම්මත කිරීමට මාස තුනකට ප්‍රථම, අයවැය ඇස්තමේන්තුවල අහිතකර හෝ අවාසිදායක බලපෑම් ඇතොත් ඒවා අවම කිරීමට සහ නිවැරදි කිරීමට හැකි වන පරිදි පූර්ව අයවැය විවාදයක් පැවැත්විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 20/'10

ගරු රවි කරුණානායක මහතා,— උද්ධමනයට ගැලපෙන සේ සේවා නියුක්තිකයන්ට 1%ක දීමනාවක් ගෙවීම,— රාජ්‍ය ආයතන විසින් පරිපාලනය කරනු ලබන සේවා නියුක්තිකයන්ගේ අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල ගෙවීමේ දී එක් එක් වර්ෂයේ උද්ධමනය ප්‍රමාණයට වඩා 1%ක දීමනාවක් සේවා නියුක්තිකයන්ට ලබා දීමට සහතික විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 21/'10

ගරු රවි කරුණානායක මහතා,— ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට නොමිලේ ගමන් පහසුකම් සැලසීම,— සියලුම ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට පොදු ගමනාගමන සේවාවන්වල නොමිලේ ගමන් පහසුකම් සලසා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 22/'10

ගරු රවි කරුණානායක මහතා,— අර්බුද සමථ මධ්‍යස්ථානයක් පිහිටුවීම,— සාමය කඩවීම වැනි ජාතික ප්‍රශ්නයක් ඇති ශ්‍රී ලංකාව බහු ජාතික හා බහු ආගමික රටක් වන හෙයින්, ශ්‍රී ලංකාව තුළ, කලාපය තුළ හා සමස්ථ වශයෙන් ලෝකයේම එවැනි ප්‍රශ්න විසදීම සඳහා බෞද්ධ, ක්‍රිස්තියානි, හින්දු හා ඉස්ලාම් ආගම්වල ශක්තිය ප්‍රයෝජනයට ගනිමින් අර්බුද සමථ මධ්‍යස්ථානයක් පිහිටු විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 23/'10

ගරු රවි කරුණානායක මහතා,— විශ්‍රාමික පාරිතෝෂික මුදල් ප්‍රමාදයකින් තොරව ලබා දීම,— මෙතෙක් විශ්‍රාමික පාරිතෝෂික මුදල් ලබා නොදුන් විශ්‍රාමිකයින්ට එම විශ්‍රාමික පාරිතෝෂික මුදල් ප්‍රමාදයකින් තොරව ලබා දීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 24/'10

ගරු රවි කරුණානායක මහතා,— ජාතික ප්‍රතිපත්ති සැලසුම් සභාවක් පත් කිරීම,— ක්‍රමවත් ජාතික ප්‍රතිපත්ති හා සැලසුම් නිර්මාණය කිරීම සඳහා දේශපාලනඥයන්ගෙන් හා විෂය බද්ධ වෘත්තීයවේදීන්ගෙන් සමන්විත ආණ්ඩු මාරුවීම් අනුව වෙනස් නොවන නිශ්චිත බලයක් සහිතවූත් ජාතික ප්‍රතිපත්ති සැලසුම් සභාවක් පත්කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 25/'10

ගරු රවි කරුණානායක මහතා,— විදේශ රැකියා නියුක්තිකයන්ගේ ගැටලු නිරාකරණය කිරීම සඳහා නීතිමය බලතල සහිත ඒකකයක් පිහිටුවීම,— විදේශ රැකියාවන්හි නියුක්ත වූවන්ට සිදුවන පහරදීම්, පැහැරගෙන යෑම්, ස්ත්‍රී දූෂණ, ලිංගික අපචාරයෙහි යෙදවීම්, මිනීමැරීම් හා විදේශගත වීමේදී සිදුවන මුදල් වංචා කිරීම් හා විදේශගත වී අනාථ වූවන් නැවත ගෙන්වා ගැනීම හා ඔවුන්ගේ ආරක්ෂාව පිළිබඳ සොයා බැලිය හැකි නීතිමය බලතල ඇති ඒකකයක් පිහිටුවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 26/'10

ගරු රවී කරුණානායක මහතා,— නව නිපැයුම්කරුවන් ලෝකයට හඳුන්වා දීම සඳහා ජාතික වැඩ පිළිවෙළක් සකස් කිරීම,— නව නිපැයුම්කරුවන් සහ විවිධ දක්ෂතා ඇති පුරවැසියන් ලෝකයට හඳුන්වාදීම සඳහා ද ඔවුන් සතු දක්ෂතා හා එකී නිර්මාණ දියුණු කර ගැනීම සඳහා ද ජාතික වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 27/'10

ගරු රවී කරුණානායක මහතා,— දේශීය අමු ද්‍රව්‍ය යොදා ගන්නා කර්මාන්තකරුවන්ට බදු සහන ලබා දීම,— සම්පූර්ණයෙන් ජාත්‍යන්තර වෙළෙඳපොල සඳහා ඉලක්ක කර ගනිමින් 75% කට වඩා දේශීය අමුද්‍රව්‍ය යොදා ගනිමින් භාණ්ඩ නිපදවන දේශීය කර්මාන්තකරුවන්ට අවුරුදු 02ක බදු සහන කාලයක් ලබා යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 28/'10

ගරු රවී කරුණානායක මහතා,— වතුකර ජනතාවට පුරවැසිකම් ලබාදීම,— වතුකරයේ ශ්‍රී ලංකා පුරවැසිකම නොමැති සියලු ජන කොට්ඨාසවලට ඔවුන්ගේ කැමැත්ත මත පුරවැසිභාවය ලබා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 29/'10

ගරු රවී කරුණානායක මහතා,— දිවයිනේ ප්‍රාථමික පාසල් දරුවන්ට නොමිලේ කිරි වීදුරුවක් ලබා දීම,— දිවයිනේ සියලු ප්‍රාථමික පාසල් දරුවන්ට උදෑසන නොමිලයේ කිරි වීදුරුවක් ලබා දීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 30/'10

ගරු රවී කරුණානායක මහතා,— සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්ති භාරකාර අරමුදල් සතියක් ඇතුළත ඉල්ලුම්කරුවන්ට ලබා දීම,— සේවක අර්ථ සාධක අරමුදල් හා සේවා නියුක්ති භාරකාර අරමුදල් සතියක් ඇතුළත ඉල්ලුම්කරුවන්ට ලබා දිය හැකි වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 31/'10

ගරු රවී කරුණානායක මහතා,— පාසල් ළමුන් සඳහා නිදහස් වාර ගමන් ප්‍රවේශ පත්‍ර ලබා දීම,— පාසල් ළමුන්ට මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ බස් රථවල ගමන් කිරීම සඳහා නිදහස් වාර ප්‍රවේශපත් ක්‍රමයක් හඳුන්වාදීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 32/'10

ගරු රවී කරුණානායක මහතා,— ක්‍රීඩා පාසල් ඉදිකිරීම හා ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් සකස් කිරීම,— දිගුකාලීන ඉලක්කයක් සහිත ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් හා වැඩ පිළිවෙළක් සකස් කිරීම උදෙසා මූලික වශයෙන් සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන පරිදි ක්‍රීඩාගාර, පිට්ටනි, උපකරණ හා ක්‍රීඩා උපදේශකයන්ගෙන් සමන්විත උසස් ගණයේ ක්‍රීඩා පාසල් ඉදි කිරීමටත් ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් සකස් කිරීමටත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 33/'10

ගරු රවී කරුණානායක මහතා,— ජාතික භාෂා අධ්‍යාපන මණ්ඩපයක් පිහිටුවීම,— ගුරුවරුන්ට සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම සඳහා ජාතික භාෂා අධ්‍යාපන මණ්ඩපයක් ස්ථාපිත කිරීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 41/'10

ගරු අජිත් කුමාර මහතා,— දේශපාලන පළිගැනීම්වලට ලක් වූවන්ට සහන සැලසීම සඳහා ජනාධිපති කොමිසමක්,— අතීතයේ සිට මේ දක්වා තමන් දරන දේශපාලන මතය නිසා පීඩාවට හා දේශපාලන පළිගැනීම්වලට ලක් වූ අයගේ පැමිණිලි විභාග කර සහන සැලසිය හැකි පූර්ණ බලැති ජනාධිපති කොමිසමක් පත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 42/'10

ගරු අජිත් කුමාර මහතා,— 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත සංශෝධනය කිරීම,— ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික කටයුතුවල නියැලෙන ගොවීන් සතු ඉඩම්වල අයිතිය විවිධ හිමිකම් යටතේ පවතින අතර ඉන් බොහෝ දෙනෙක් අද ගොවියන් වන හෙයින් ද, ඉහත පනත මගින් අද ගොවි ක්‍රමය අහෝසි කිරීමේ හේතුවෙන් අද ගොවීන් ගොවි බිම් වලින් නෙරපා දමා ඇති අතර නීතිමය රැකවරණයක් නොමැතිකමින් විවිධ ගැටුම්කාරී තත්ත්වයන් නිර්මාණය වෙමින් පවතින හෙයින් ද, අද ගොවීන්ට වූ එම අසාධාරණය දුරුලීම සඳහා 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත සංශෝධනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 43/'10

ගරු අජිත් කුමාර මහතා,— උස්සන්ගොඩ කඳුවැටිය පිහිටි භූමිය සංරක්ෂණය කිරීම,— ප්‍රාග් ඓතිහාසික යුගයේ මධ්‍යම පුරාශීලා යුගයට අයත් යැයි හඳුනාගෙන ඇති දකුණු පළාතේ අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මුහුදු වෙරළ තීරයේ පිහිටා ඇති දකුණේ හෝර්ටන් තැන්න නමින් ප්‍රකට උස්සන්ගොඩ කඳුවැටිය පිහිටා ඇති භූමිය, ශ්‍රී ලංකාවේ විවෘත ජනාවාසයකින් අවුරුදු විසි අටදහසක් පැරණි ජ්‍යාමිතික ආයුධ හා පාෂාණ සොයාගත් භූමියක් ලෙස ද, සාගර හා ගොඩබිම් ජෛව විවිධත්වය අතින් ඉතා පොහොසත් භූමියක් ලෙස ද, කදිම කැස්බෑ වාසස්ථානයක් ලෙස ද, සුනාමි රළ පහරින් ජනතාව ආරක්ෂා කළ පවුරක් ලෙස ද, අතිශය වටිනාකමක් උරුම කරගෙන ඇති හෙයින් එම භූමිය තුළ ආරම්භ කිරීමට යෝජිත ව්‍යාපෘති නවතා දමා වහාම සංරක්ෂණය කළ යුතු පරිසර පද්ධතියක් ලෙස ප්‍රකාශයට පත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 44/'10

ගරු රවී කරුණානායක මහතා,— රාජ්‍ය තොරතුරු නිදහස්ව ලබා ගැනීම සඳහා නීති සම්පාදනය කිරීම,— රජයේ විනිවිදභාවය පවත්වා ගැනීම සඳහා ද, මහජනතාවට සියලු රාජ්‍ය තොරතුරු නිදහස්ව ලබා ගැනීමේ අයිතිය උදෙසා ද පාර්ලිමේන්තුව තුළ නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.45/'10

ගරු රවී කරුණානායක මහතා,— ශ්‍රී ලාංකිකයින්ට වඩා යහපත් සෞඛ්‍ය අවස්ථාවන් සලසා දීම,— ජනතාවගෙන් විශාල පිරිසකට හදවත් සැත්කම් කිරීම අවශ්‍යව ඇති හෙයින්, ශ්‍රී ලාංකිකයන්ට වඩා හොඳ සෞඛ්‍ය අවස්ථාවන් සලසා දිය යුතු යැයි ද, ඒ සඳහා පෞද්ගලික අංශයේ සේවකයින්ට සේවක අර්ථසාධක අරමුදල හෝ සේවක භාරකාර අරමුදල හරහා නොමිලයේ පහසුකම් සලසා දිය යුතුයැයි ද, රජයේ සේවකයන් හෝ සේවා වියුක්තිකයන් සඳහා සම්පූර්ණ වියදම රජය විසින් ජනාධිපති අරමුදල හරහා සැපයිය යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.46/'10

ගරු රවි කරුණානායක මහතා,— ලෝක පරිසරය ආරක්ෂා කිරීම,— ශ්‍රී ලංකාව, ලෝක පරිසරය ආරක්ෂා කිරීම කෙරෙහි දැඩි අවධානය යොමු කළ යුතු අතරම ගෝලීය උණුසුම වැළැක්වීමට විශේෂයෙන් පියවර ගතයුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.47/'10

ගරු රවි කරුණානායක මහතා,— පාර්ලිමේන්තුවේ වැඩකටයුතු විකාශනය කිරීම,— රූපවාහිනිය හෝ අන්තර්ජාලය හරහා පාර්ලිමේන්තුවේ වැඩ කටයුතු සජීවීව හෝ පරීක්ෂිතව විකාශනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.48/'10

ගරු රවි කරුණානායක මහතා,— එතෙර ජීවත් වන ශ්‍රී ලාංකිකයන්ට ඡන්දය ප්‍රකාශ කිරීමට අවසර දීම,— එතෙර ජීවත්වන ශ්‍රී ලාංකිකයන්ට ඉදිරි මැතිවරණ සඳහා ඡන්දය ප්‍රකාශ කිරීමට අවසර දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.49/'10

ගරු රවි කරුණානායක මහතා,— විද්‍යුත් ඡන්ද ප්‍රකාශ කිරීමේ ක්‍රමයක් හඳුන්වාදීම,— යල්පැන ගිය වර්තමාන ඡන්දය ප්‍රකාශ කිරීමේ ක්‍රමය වෙනුවට විද්‍යුත් ඡන්දය ප්‍රකාශ කිරීමේ ක්‍රමයක් හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.50/'10

ගරු අජිත් කුමාර මහතා,— ශ්‍රී ලංකාවේ වටිනා ස්වභාවික සම්පත් හා ඒ ආශ්‍රිත ප්‍රදේශ ආරක්ෂා කිරීම සඳහා විධිමත් විද්‍යාත්මක සැලැස්මක් ක්‍රියාත්මක කිරීම,— ශ්‍රී ලංකාවේ පමණක් නොව ලෝකයේම වටිනා ස්වාභාවික සම්පත් ලෙස සැලකෙන සිංහරාජ වනාන්තරය, කන්නෙලිය රක්ෂිත වනාන්තරය, රූමස්සල කන්ද, කොග්ගල ඔය දූපත් හා කඩොලාන පද්ධතිය, රම්සා තෙත් බිමක් වන මාදු ගඟ හා ඒ ආශ්‍රිත ප්‍රදේශ ආරක්ෂා කිරීමටත්, ප්‍රවර්ධනය කිරීමටත් විධිමත් විද්‍යාත්මක සැලැස්මක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.51/'10

ගරු අජිත් කුමාර මහතා,— ගාලු කොටුව හා ඒ ආශ්‍රිත ඓතිහාසික හා පුරා විද්‍යාත්මක උරුමයන් ආරක්ෂා කිරීම, ප්‍රවර්ධනය කිරීම හා නිසි ප්‍රයෝජන ලබා ගැනීමට කටයුතු කිරීම,— සංචාරක කර්මාන්තයේ ඉතා වැදගත් මධ්‍යස්ථානයක් වූ ද, ඓතිහාසික හා පුරා විද්‍යාත්මක වටිනාකමකින් යුතු වූ ද, ලෝක උරුමයක් ලෙස සැලකෙන ගාලු කොටුපවුර, ගාලු කොටුව ඇතුළත හා ගාලු කොටුව ආශ්‍රිතව ඇති ඓතිහාසික හා පුරා විද්‍යාත්මක උරුමයන් ආරක්ෂා කිරීමටත්, ප්‍රවර්ධනය කිරීමටත්, ඒ හා සම්බන්ධ රාජ්‍ය ආයතන හා ජන සහභාගීත්වය ඇතිව විධිමත් සැලැස්මක් ක්‍රියාත්මක කරමින් අප රටට මෙම ඓතිහාසික උරුමයේ නිසි ප්‍රයෝජන ලබා ගැනීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.53/'10

ගරු තිලංග සුමතිපාල මහතා,—කොළඹ නගරයේ වැසි ජලය බැස යාම ක්‍රමවත් කිරීම,— කොළඹ නගරයේ තවමත් පවතින්නේ වසර 100 කටත් වඩා පැරණි ජලය බැස යන කාණු පද්ධතියක් වන අතර එය නිසියාකාරව ක්‍රියාත්මක නොවන බැවින් පැය භාගයක පමණ අඛණ්ඩ වර්ෂාවකින් කොළඹ නගරයම ජලයෙන් යටවන තත්ත්වයකට පත්ව ඇති හෙයින්ද, අවිධිමත් ලෙස ඉදිකරන ලද නිවාස, ගොඩනැගිලි හා අනවසර ඉදිකිරීම්වලින් පරිසරයට හානි සිදුවන හෙයින්ද, අධික වැසි අවස්ථාවලදී කොළඹ නගර සහා බල ප්‍රදේශය තුළ ඇතිවන ගංවතුර ආපදා තත්ත්වය අවම කිරීම සඳහා වැසි ජලය ක්‍රමවත්ව බැස යාමට හැකිවන පරිදි අදාළ කාණු පද්ධතිය නවීකරණය හා ශුද්ධ පවිත්‍ර කර විධිමත්ව පවත්වාගෙන යා යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.54/'10

ගරු තිලංග සුමතිපාල මහතා,— වෛද්‍ය ක්ෂේත්‍රයේ වෘත්තීමය වටිනාකම සුරැකීම,—දේශීය හා ජාත්‍යන්තර වෛද්‍ය ක්‍රමය තුළ වෘත්තීමය සුදුසුකම් හා අත්දැකීම නොමැති වෛද්‍යවරුන් හා වෛද්‍යවරියන් ප්‍රතිකාර කිරීමෙහි යෙදී සිටීම තුළින් සාමාන්‍ය රෝගී ජනතාවට විශාල ගැටලු වලට මුහුණ පෑමට සිදුවීමෙන් අසරණ තත්ත්වයකට පත්ව ඇති හෙයින් ද, ඒ තුළින් වෛද්‍ය ක්ෂේත්‍රය තුළ සිටින්නා වූ සුදුසුකම් ඇති වෛද්‍ය වෘත්තිකයන් සමාජය තුළ අවමානයට පත්ව ඇති හෙයින්ද, වෛද්‍ය ක්ෂේත්‍රයේ වෘත්තීමය වටිනාකම සුරැකීමට, ක්‍රමවත්ව හා විධිමත්ව නීත්‍යානුකූලව ක්‍රියාත්මක විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.55/'10

ගරු තිලංග සුමතිපාල මහතා,— මාධ්‍ය නිදහස හා තොරතුරු දැනගැනීමේ අයිතිය තහවුරු කිරීම,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළම තොරතුරු දැනගැනීමේ හා ප්‍රකාශ කිරීමේ අයිතිය තහවුරු කර ඇති හෙයින් ද, තාක්ෂණය දියුණු වෙමින් පවතින ලෝකයක සත්‍ය සැඟවීමට හෝ වසන් කිරීමට අවස්ථාවක් නොමැති හෙයින් ද, ප්‍රජාතාන්ත්‍රික රටක සියලු පුරවැසියන්ට නිදහස් මාධ්‍ය තුළින් දැනුම හා අවබෝධය ලබාගැනීමේ අවකාශය ලබාදිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.56/'10

ගරු තිලංග සුමතිපාල මහතා,—ක්‍රීඩාව තුළින් නිරෝගීමත් සමාජයක් නිර්මාණය කිරීම,— ළමා අවධියේදීම දරුවන් ක්‍රීඩාවට යොමු කිරීම තුළින් නිරෝගීමත් සමාජයක් බිහිකිරීමටත්, සහජ කුසලතා ඇති දරුවන් ජාත්‍යන්තර තලයට යොමු කිරීමටත්, ලොව සුපතල ක්‍රීඩකයින් බිහි කර රටට කීර්තියක් ලබා ගැනීමටත් හැකිවන පරිදි ජාති භේදයෙන් පන්ති භේදයෙන් තොරවූ සාධාරණ ක්‍රම වේදයක් රාජ්‍ය මට්ටමින් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.57/'10

ගරු රවී කරුණානායක මහතා,— ඡන්ද හිමි නාම ලේඛනය නිරතුරුව යාවත්කාලීන කිරීම,— ඡන්ද හිමි නාම ලේඛනය මුළු වර්ෂයෙන්ම දින තිහක කාලයක් සඳහා පමණක් යාවත්කාලීන වන ලයිස්තුවක් නොව නිරතුරුවම යාවත් කාලීන වන විවෘත ලැයිස්තුවක් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.59/’10

ගරු රවී කරුණානායක මහතා,— විදේශ රැකියාවල නියුතු අය සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමයක් ලබාදීම, —විදේශ ගතවී ඉතා අපහසුවෙන් උපයාගත් ධනය ශ්‍රී ලංකාවේ ධන සම්පත්තිය වැඩිකිරීම සඳහා එවන විදේශ රැකියාවල නියුතු අය ඇගයීම පිණිස විශ්‍රාම වැටුප් ක්‍රමයක් ලබා දීම සඳහා පියවර ගතයුතු බව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.60/’10

ගරු රවී කරුණානායක මහතා,— 2009 මැයි 19 දිනට පෙර සේවයේ සිටි සන්නද්ධ සේනාවන් සඳහා විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීම,—පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වසර පහක සේවා කාලය සම්පූර්ණවූ පසු විශ්‍රාම වැටුප් ලැබීමට සුදුසුකම් ලබන බැවින් සන්නද්ධ සේනාවන්වල අවුරුදු 22 ක කාලය සම්පූර්ණ නොකළද 2009 වර්ෂයේ මැයි 19 වන දිනට පෙර ක්‍රියාකාරී සේවයේ යෙදී සිටි යුධ සෙබළුන්ට ද විශ්‍රාම වැටුප් ලබා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.62/’10

ගරු රවී කරුණානායක මහතා,— දුබල හා එහා මෙහා යා නොහැකි පුද්ගලයන් සඳහා විශේෂ සැලසුම් හඳුන්වාදීම,— නීතියේ සඳහන් වන පරිදි දුබල හා එහා මෙහා යා නොහැකි පුද්ගලයන්ගේ පහසුව තහවුරු කිරීමට හා ඔවුන් සතු ඵලදායීතාව වර්ධනය කිරීම සඳහාත් ඔවුන් අනවශ්‍ය ලෙස අනුන් මත යැපීම අවම කිරීම සඳහාත් සියලු නව රජයේ ගොඩනැගිලිවල විශේෂිත සැලසුම් ක්‍රමයක් ඇතිකළ යුතු බව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.63/’10

ගරු රවී කරුණානායක මහතා,— ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය තහවුරු කිරීම,— ලියාපදිංචිවූවද ඡන්දය ප්‍රකාශකිරීමට අවස්ථාව නොලැබුනු ඡන්දදායකයන් බොහෝ සංඛ්‍යාවක් සිටින බැවින් වයස අවුරුදු 18 ට වැඩි සියලුම පුද්ගලයන්ට ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය ලබා දිය යුතු බව සහ ඡන්ද හිමි නාමලේඛනයේ නම සඳහන්වූ නමුත් ඡන්දය ප්‍රකාශ නොකරන පුද්ගලයන්ගෙන් දඩ මුදලක් අයකළ යුතුබව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.64/’10

ගරු රවී කරුණානායක මහතා,— දූෂණයෙන් තොර ලෝකයක් තහවුරු කිරීම— දූෂණය මුලින් උපුටා දැමීම සඳහා ලෝකයේ පාර්ලිමේන්තු සංවිධාන සමඟ එක්වී ශ්‍රී ලාංකික පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කටයුතු කළ යුතු බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.65/’10

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— කාදී අධිකරණ පද්ධතියට නිසි ස්ථානය ලබා දීම,— 1929 දරණ මුස්ලිම් විවාහ හා දික්කසාද ආඥාපනත යටතේ කාදී අධිකරණ පද්ධතිය ශ්‍රී ලංකාවේ ස්ථාපිත කළ අතර ඉන් පසුව 1951 දී මුස්ලිම් විවාහ හා දික්කසාද පනත යටතේ සංශෝධනය කරන ලද එම ආඥාපනත මුස්ලිම් පවුල්වල පැනනගින ගැටලු පිළිබඳ සියළුම කාරණා සම්බන්ධ තීරණයන් ගැනීමට කාදී විනිශ්චකාරවරුන්ගේ බල තල වැඩිකළ යුතු අතර එම පද්ධතියේ ගෞරවයට නිසි තැන ලබා දෙමින් නඩු විභාග වාර නිසි පරිදි පැවැත්වීමට කාදී අධිකරණ පද්ධතියේ තත්ත්වය උසස් කළ යුතු බව සහ අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කාදී විනිශ්චකාරවරුන් පත්කරන බැවින් සෙසු අධිකරණ නිලධාරීන් හට හිමි වන ගරුත්වය හා පිළිගත් වැටුප් තලය මත ස්ථාන ගත කළ යුතු බව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 69/'10

ගරු රවි කරුණානායක මහතා,— මුළාවට ලක්වූ තැන්පත්කරුවන්ට තම මුදල් නැවත ගෙවීම,— ව්‍යාජ මූල්‍ය ආයතනවල තම මුදල් තැන්පත්කර එමඟින් මුළාවට ලක්වූ බොහෝ දෙනෙක් සිටින බැවින් හා පසුගිය 2009/2010 මැතිවරණ ව්‍යාපාරයේදී මෙම රජය විසින් තැන්පත්කරුවන් සහ මූල්‍ය ආයතනවලට ඔවුන්ගේ හිඟ මුදල් නැවත ගෙවීමට පොරොන්දුවී ඇති බැවින්, මහ බැංකුව මෙම ආයතනවල භාරකරු හෙයින් වඩා කාර්යක්ෂම ලෙස කටයුතු කළ යුතු බවත්, තැන්පත්කරුවන්ට තම හිඟ මුදල ලබා දීමට රජය ඉදිරිපත් විය යුතු බවත්, මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 71/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— දේශීය ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා සාමවිනිසුරු පත්වීම් ලබා දීම,— දේශීය ආයුර්වේද වෛද්‍යවරුන් මුදල් සහ වරප්‍රසාද අපේක්ෂාවෙන් තොරව ඔවුන්ගෙන් සමාජයට ඉටුවිය යුතු සමාජ වගකීමක් ලෙස සලකා විශේෂයෙන් ග්‍රාමීය ජනතාවට විශාල සේවාවක් ඉටු කරනු ලබන බැවින් එම සේවාවට ගරු කිරීමක් ලෙස ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී ඇති සියළුම දෙනාට සාමවිනිසුරු පදවි ලබා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 72/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— සාමවිනිසුරු තනතුරු ලබා දීමේ දී විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීම,— මුළු මහත් සමාජයම පොදුවේ පිළිගනු ලබන සහ සමාජයට විශාල සේවාවක් සපයනු ලබන තනතුරක් වන සාමවිනිසුරු තනතුරු ලබා දීමේදී ඒ සඳහා සුදුසු නිර්නායක පදනම් කොට ගෙන එම තනතුරු ලබා නොදීම නිසා එම තනතුරෙහි ගෞරවය හා පොදු පිළිගැනීම ක්‍රමයෙන් හීන වන බැවින් ඒ සඳහා පොදුවේ පිළිගත හැකි නිර්නායක පදනම් කර ගන්නා වූ ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.74/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— සුනාමි ඛේදවාචකයෙන් ඇතිවූ ගැටලු විසඳීම,— සුනාමි ඛේදවාචකය හේතුවෙන් කුමන හෝ ආකාරයේ ගැටලුවකට මුහුණ දී මේ වන තෙක් නොවිසඳී පවතින ගැටලු තිබේ නම්, ප්‍රාදේශීය ලේකම්, දිස්ත්‍රික් ලේකම් කොට්ඨාස මට්ටමින් සොයා බලා ඔවුන් මුහුණ දී ඇති හා දැනටත් මුහුණ දෙනු ලබන ගැටලු අවම කිරීම සඳහා කාර්යක්ෂම වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.75/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— ගෘහස්ථ ශ්‍රමිකයින් සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ විවිධ රැකියා උත්පාදන ක්ෂේත්‍ර තුළ විවිධ නිෂ්පාදන කටයුතු කරන දසලක්ෂයකට ආසන්න ගෘහස්ථ ශ්‍රමිකයින් සඳහා දේශපාලන බල අධිකාරිය ඒ සඳහා සබැඳි සියලු ක්ෂේත්‍රයන්හි ප්‍රවීණයින්, උගතුන් හා බුද්ධිමතුන්ගෙන් මෙන්ම රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනයන්හි ද සහාය ලබා ගනිමින් විධිමත් ජාතික ප්‍රතිපත්තියක් සකස් කොට එය කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.76/'10

ගරු බුද්ධික පතිරණ මහතා,—වී වගා කළ නොහැකි කුඹුරු ඉඩම් එළදායි කටයුතු සඳහා යොදා ගැනීම,—කුඹුරු ඉඩම් ගොඩකිරීමේ නීතිය උල්ලංඝනය නොවන පරිදි, විධිමත් අධ්‍යයනයකින් හඳුනා ගැනීමෙන් පසු කිසිසේත්ම වී වගා කළ නොහැකි කුඹුරු ඉඩම්වල එළදායී කෘෂි නිෂ්පාදන පමණක් වගා කිරීමටත් ,ඉදිකිරීම් කටයුතු සඳහා කිසිසේත්ම ඉඩ ප්‍රස්ථා නොලැබෙන ආකාරයේ වැඩසටහන් සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.77/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය සේවයේ විශ්‍රාමකයින්ගේ වැටුප් විෂමතා ඉවත් කිරීම,— 2006/6 වැටුප් ප්‍රතිශෝධන චක්‍ර ලේඛයට අනුව 2006.06.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි රාජ්‍ය සේවකයන්ගේ වැටුප් පරිවර්තනය කිරීම නිසා 2006.06.01 දිනට පෙර විශ්‍රාම ගිය සහ ඉන්පසු විශ්‍රාම ගිය රාජ්‍ය සේවකයන් අතර දැඩි වැටුප් විෂමතාවක් පවතින බැවින් එය ඉවත් කිරීමට ජාතික වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.78/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— දිස්ත්‍රික් මට්ටමින් තොරතුරු මධ්‍යස්ථාන ඇති කිරීම,— භූගෝලීය පිහිටීම, ඓතිහාසික පසුබිම, වගාකරන භෝග වර්ග, මාර්ග පද්ධතිය, රජයේ කාර්යාල, පාසල්, විශ්වවිද්‍යාල, දුම්රිය ස්ථාන සහ බස් නැවතුම් පොළවල් ආදි සියලුම තොරතුරු පරිගණක ගත කරන ලද හා ලේඛන ගත කරන ලද තොරතුරු මධ්‍යස්ථාන ඇති කිරීමටත්, එහි පළමු පියවරේදී පළාත් මට්ටමින්, දෙවැනි පියවර ලෙස දිස්ත්‍රික් මට්ටමින් සහ තෙවැනි පියවර ලෙස ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ මට්ටමින් මෙම මධ්‍යස්ථාන ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.79/'10

ගරු බුද්ධික පතිරණ මහතා,—ශ්‍රී ලංකාවේ දහම් පාසල් අධ්‍යාපනය හා පරිපාලනය විධිමත් කිරීම,— ශ්‍රී ලංකාවේ සියලුම ආගම්වල දහම් පාසල් අධ්‍යාපනය හා පරිපාලනය වඩාත් විධිමත් කිරීමට සහ බෞද්ධ දහම් පාසල් තුළ පවත්නා දහම් අවසාන හා ධර්මාචාර්ය විභාග මෙන්ම සියලුම ආගම්වල දහම් පාසල් තුළ පැවැත්වෙන ඒ හා සමාන විභාග සහතික පත්‍ර සඳහා නිසි පිළිගැනීමක් ලබා දීමට, දහම් පාසල් සඳහා අඛණ්ඩව මානව සම්පත් හා භෞතික සම්පත් ලබා දීමෙන් දහම් පාසල් සඳහා පැමිණෙන සිසුන් සංඛ්‍යාව වැඩි කිරීමට කඩිනම් වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.80/'10

ගරු බුද්ධික පතිරණ මහතා,—සුනඛයින්, බළලුන් වැනි සුරතල් සතුන් ඇති කිරීම සම්බන්ධ නීති සම්පාදනය,— නිවෙස්වල හෝ අලෙවි කිරීම සඳහා ඇති කරන සුනඛයින්, බළලුන් වැනි සුරතල් සතුන් පළාත් පාලන ආයතනවල ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍ය නීති සම්පාදනය කළ යුතු අතර, එම සතුන්ගේ පැටවුන් අලෙවි කිරීම නීත්‍යානුකූලව අවසර ලත් මධ්‍යස්ථානවලදී පමණක් සිදු කළ යුතු බවත්, එසේ නොවන ස්ථානවල ඇති කරන ගැහැණු සතුන් අනිවාර්යයෙන්ම වන්ද්‍යාකරණයට ලක් කිරීමටත්, අවශ්‍ය නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 81/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— රැකියා වෙළඳපොළට අවශ්‍ය ශ්‍රමිකයින් පුහුණු කිරීම—, අනාගත ශ්‍රී ලංකාවේ බිහිවන නව රැකියා අවස්ථා සඳහා අවශ්‍ය ශ්‍රමිකයින් පුහුණු කිරීමේ ක්‍රමවේදයකට මුල පිරීමේ කාර්යය වඩාත් කාර්යක්ෂම ලෙස රට තුළ පවත්නා සියලුම තෘතීක අධ්‍යාපන ආයතන මගින් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 82/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය පරිපාලන ව්‍යුහය ප්‍රතිසංවිධානය කිරීම,— දැනට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මගින් ග්‍රාම නිලධාරී වසම් යළි සීමා නිර්ණය කිරීම සඳහා කටයුතු කරගෙන යමින් සිටින බැවින් එසේ සීමා නිර්ණය කරනු ලබන ග්‍රාම නිලධාරී වසම් තුළින් නව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ සීමා සහ නව දිස්ත්‍රික් සීමා නිර්ණය කළ යුතු බවත්, මෙසේ නිර්ණය කරනු ලබන ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය පළාත් පාලන ආයතන බල ප්‍රදේශය බවට පත්කළ යුතු අතර එකී බල ප්‍රදේශයට කොට්ඨාස අධ්‍යාපන බල ප්‍රදේශය, පොලිස් බල ප්‍රදේශය, ගොවිජන සේවා බල ප්‍රදේශය, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා නිලධාරී බල ප්‍රදේශය ඇතුළු සියලු රාජ්‍ය ආයතනයන්හි බල ප්‍රදේශ සීමා සංයුක්ත වන පරිදි සමස්ත රාජ්‍ය ව්‍යුහයම ප්‍රතිසංවිධානය විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 83/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— නිල්වලා ගඟ ව්‍යාපාරයේ ඉදිරි සංවර්ධන කටයුතු යළි ආරම්භ කිරීම,— මාතර දිස්ත්‍රික්කයේ නිල්වලා ගඟ ව්‍යාපාරයේ සංවර්ධන කටයුතු අතර මග ඇන හිටීමෙන් එම මිටියාවතේ පෝෂක ප්‍රදේශයන්හි භව භෝග වගා කරන ජනතාවට මුහුණ පෑමට සිදුවී ඇති ගැටලු කඩිනමින් විසඳීමට පියවර ගත යුතු බවත්, නිල්වලා ගඟ ව්‍යාපාරයේ ඉදිරි සංවර්ධන කටයුතු කඩිනමින් යළි ආරම්භ කළ යුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 84/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයිනගේ නිල කාලයට පසුද සාමවිනිසුරු පදවිය ලබාදීම,— පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයින්ට දෙනු ලබන සාමවිනිසුරු තනතුරු ඔවුන්ගේ නිල කාලයට පමණක් සීමාවන බැවින්, නිල කාලයෙන් පසුවත් ඔවුන්ගෙන් එම සේවාව ලබා ගැනීම සඳහා පැමිණෙන විශාල පිරිසක් අපහසුතාවයට පත්වන බැවින්, එම මහජන නියෝජිතයන්ට තම නිල කාලයෙන් පසුවත්, සාම විනිසුරු තනතුරු ලබා දීම සඳහා සුදුසු වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 85/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— සියළුම පළාත් සභා ජනතා නියෝජිතයන්ගේ දීමනා හා වරප්‍රසාද පිළිබඳව නැවත සලකා බැලීම,— දිවයිනේ දැනට ක්‍රියාත්මක වන පළාත් සභා හා ඉදිරියේදී විධිමත්ව ක්‍රියාත්මකවීමට නියමිත උතුරු පළාත් සභාවේ ගරු අමාත්‍යවරුන්, සභාපතිවරුන්, උපසභාපතිවරුන්, ආණ්ඩු පාර්ශ්වයේ සංවිධායකවරුන්, සභා නායකවරුන්, විරුද්ධ පාර්ශ්වයේ නායකවරුන්, විරුද්ධ පාර්ශවයේ ප්‍රධාන සංවිධායකවරුන් සහ ගරු මන්ත්‍රීවරුන්ගේ දීමනා, වරප්‍රසාද හා පහසුකම් ක්‍රමවත් තත්වයක නොපවතින බැවින් මේ පිළිබඳව ගැඹුරින් සලකා බලා ඒ සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 86/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන ආයතන වල සියලුම මහජන නියෝජිතයින්ගේ දීමනා හා වරප්‍රසාද පිළිබඳ නැවත සලකා බැලීම,—දිවයිනේ ක්‍රියාත්මක වන හා ඉදිරියේදී ක්‍රියාත්මකවීමට නියමිත සියලුම මහ නගර සභා, නගර සභා හා ප්‍රාදේශීය සභාවන්හි පුරපතිවරයන්, නගරාධිපතිවරයන්, සභාපතිවරයන්, නියෝජ්‍ය පුරපතිවරයන්, නියෝජ්‍ය නගරාධිපතිවරයන්, උප සභාපතිවරුන්, විපක්ෂනායකවරයන් හා මන්ත්‍රීවරයන්ගේ දීමනා, වරප්‍රසාද සහ අනෙකුත් පහසුකම් ක්‍රමවත් තත්වයක නොපවතින බැවින් මේ පිළිබඳව ගැඹුරින් සලකා බලා ඒ සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.87/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— උතුරු නැගෙනහිර අතුරුදහන් වූ දෙමළ ජනතාවට මරණ සහතික ලබා දීම,— උතුරු නැගෙනහිර ප්‍රදේශවල යුද්ධය පැවති පසුගිය දශක තුනක පමණ කාලය තුළ විවිධ හේතූන් නිසා අතුරුදහන් වී ඇති පුද්ගලයන් මේ වන විට ජීවතුන් අතර සිටී ද නැද්ද යන්න කඩිනමින් පරීක්ෂණ පවත්වා ඔවුන් ජීවතුන් අතර නොමැති නම් ඔවුන් සඳහා මරණ සහතික ලබා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 88/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික තරුණ ප්‍රතිපත්තියක් සකස් කිරීම,— සියළුම දේශපාලන පක්ෂ නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගෙන් සමන්විත විශේෂ කාරක සභාවක් පත්කොට ශ්‍රී ලංකාවට යෝග්‍යවූ ජාතික තරුණ ප්‍රතිපත්තියක් සකස් කිරීම ආරම්භ කළ යුතුයැයි ද, ඒ සඳහා ඒ හා සබැඳි සියලු ක්ෂේත්‍රයන් නියෝජනය වන පරිදි ප්‍රවීණයන්, උගතුන් හා බුද්ධිමතුන්ගෙන් මෙන්ම රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනයන්හි සහාය ලබා ගත යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 89/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— රජයේ පාසල් හා විශ්වවිද්‍යාල නිවාඩු දිනවලදී එම මධ්‍යස්ථාන අධ්‍යාපන ඒකක සඳහා ලබාදීම,—රජයේ පාසල් නිවාඩු කාලයේදී සහ සවස් වරුවලත් විශ්වවිද්‍යාල නිවාඩු දිනවලත් එම මධ්‍යස්ථාන මුල් කොට ගෙන ව්‍යාපාරික ප්‍රජාව, රාජ්‍ය නොවන සංවිධාන, වාණිජ මණ්ඩල, ප්‍රජා මූල සංවිධාන සම්බන්ධ කර ගන්නා වූ පුළුල් වැඩ පිළිවෙළක් වශයෙන් වැඩිහිටි හා නොවිධිමත් අධ්‍යාපන ඒකක සහනදායී ගාස්තු පදනමක් මත ආරම්භකළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 90/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— පුරප්පාඩු වන ග්‍රාම නිලධාරී තනතුරු වල වැඩ බැලීමේ පත්වීම් සඳහා කාර්යක්ෂම වැඩ පිළිවෙළක් සකස් කිරීම,— ග්‍රාම නිලධාරී තනතුරක පුරප්පාඩු ඇති වූ විට ආසන්න ග්‍රාම නිලධාරී වසමේ ග්‍රාම නිලධාරීවරයා වැඩ බැලීම සඳහා පත් කරනු ලබන්නේ ඉතා සුළු දීමනාවක් යටතේ බැවින් ද, මෙම වැඩ බැලීමේ පත්වීම් තුළින් ග්‍රාම නිලධාරී වසම් දෙකෙහිම කාර්යක්ෂමතාව බිඳ වැටෙන බැවින්ද, එම තත්වය මග හරවා ගැනීම සඳහා සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම ග්‍රාම නිලධාරී සංචිතයක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ පිහිටුවිය යුතු අතර පුරප්පාඩු සිදුවන වසම සඳහා එකී සංචිතය තුළින් ග්‍රාම නිලධාරීන් පත් කිරීම සහ එම සංචිතය තුළ සිටින ග්‍රාම නිලධාරීන්ට ප්‍රාදේශීය ලේකම් විසින් පවරනු ලබන වෙනත් ඵලදායී ක්ෂේත්‍ර හෝ රාජකාරී සඳහා යෙදවීමේ වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 91/’10

ගරු බුද්ධික පතිරණ මහතා,— වර්තමානයේ ක්‍රියාත්මක වන සිවිල් ආරක්ෂක කමිටුවලට නිල පිළිගැනීමක් ලබා දීම,— සෑම ග්‍රාම නිලධාරී වසමකම පිහිටා ඇති ආගමික සිද්ධස්ථානයන්හි නායක ස්වාමීන්වහන්සේ, පූජකතුමා, විදුහල්පතිතුමා, ග්‍රාම නිලධාරී, සමෘද්ධි සංවර්ධන නිලධාරී, කෘෂිකර්ම පර්යේෂණ සහකාරවරයා, ජන සභා ලේකම්වරු, ප්‍රදේශයේ පොලිස් ස්ථානය නියෝජනය කරන නිලධාරියකු සහ එම ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ස්වේච්ඡා සංවිධාන, රාජ්‍ය හා පෞද්ගලික අංශ වල සේවය කරන අදාළ වසමේ පදිංචිව සිටින නියෝජිතයින්ගෙන් සමන්විත සිවිල් ආරක්ෂක කමිටු ගොඩනැගීමට වඩාත් පහසුවීම සඳහා වර්තමාන සිවිල් ආරක්ෂක කමිටුවලට නිල පිළිගැනීමක් ලබා දිය හැකි පරිදි පාර්ලිමේන්තු පනතක් සම්මත කළ යුතු යැයි ද, ඒ තුළින් ග්‍රාම නිලධාරී වසම තුළ සිදුවන අපරාධ හා දුරාචාර, නීති විරෝධී කටයුතු පිළිබඳ අදාළ අංශ සමඟ මනා සම්බන්ධීකරණයක් ගොඩනැගීමට හැකි වන පරිදි අදාළ නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 92/’10

ගරු බුද්ධික පතිරණ මහතා,— දිවයින තුළ දැනට ක්‍රියාත්මක වන යල් පැන ගිය නීති අණපනත් යාවත්කාලීන කිරීම,— ශ්‍රී ලංකාවේ මේ වනවිටත් අධිරාජ්‍යවාදී යුගයේදී හඳුන්වාදෙන ලද නීති අණපනත් ක්‍රියාත්මකවන බැවින් එම නීති අණපනත් යළි අධ්‍යනය කිරීමේ කමිටු පත්කර, යල් පැනගිය දඩුවම්, දඩ මුදල් ආදිය යාවත්කාලීන කිරීමේ ජාතික වැඩපිළිවෙලක් ක්‍රියාවට නැංවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 93/’10

ගරු බුද්ධික පතිරණ මහතා,— සියලු මැතිවරණ එකම දිනක පැවැත්වීම,— ශ්‍රී ලංකාව තුළ 1988 සිට 2010 දක්වා වසර 22 ක කාලය තුළ 1990, 1992, 1995, 1996, 1998, 2003 සහ 2007 වසරවලදී හැර අන් සෑම වසරකදීම කිසියම් මැතිවරණයක් පවත්වා ඇති අතර, එසේ මැතිවරණ පැවැත්වීම ජනතා මතය සලකා බැලීම සඳහා වටිනා නිර්ණායකයක් වුවද, මේ තුළින් රටේ ආර්ථිකය, පරිපාලනය ආදි සෑම ක්ෂේත්‍රයකටම දැඩි බලපෑමක් ඇති කරන බැවින් පළාත් පාලන මැතිවරණ, මහා මැතිවරණ සහ ජනාධිපතිවරණය එකම දිනයකදී පැවැත්වීමට හැකි වන පරිදි එකී ආයතනවල නිල කාලය සංශෝධනය කිරීමටත්, ගැලපෙන මැතිවරණ ක්‍රමවේදයක් නිර්මාණය කිරීමටත් සුදුසු පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 94/’10

ගරු බුද්ධික පතිරණ මහතා,— පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමට කටයුතු කිරීම,— රට තුළ ප්‍රජාතන්ත්‍රවාදය වඩාත් ශක්තිමත් කිරීමේ අරමුණ ඇතිව පාර්ලිමේන්තුව හා පළාත් සභා අතරත්, පළාත් සභා හා පළාත් පාලන ආයතන අතරත් මනා සම්බන්ධීකරණයක් පවත්වා ගෙන යාම අත්‍යාවශ්‍ය වන අතර ඒ සඳහා පළාත් පාලන ආයතන ප්‍රධානීන්, පළාත් සභා තුළ නියෝජනයවීම සහතිකවනු පිණිස ද, පළාත් සභා ප්‍රධානීන් පාර්ලිමේන්තුව තුළ නියෝජනය වීම සහතිකවනු පිණිසද ක්‍රමවේදයක් සකස් කිරීමට අවශ්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 95/’10

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික ඒකාග්‍රතාව ඇති කිරීමට පියවර ගැනීම,— ජාතික ඒකාග්‍රතාවය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් දෙමළ භාෂාව කථා කරන ජනතාව ජීවත් වන ප්‍රදේශවල සිංහල භාෂා පුහුණු වැඩ සටහන් ද, සිංහල භාෂාව කථා කරන ජනතාව ජීවත් වන ප්‍රදේශවල දෙමළ භාෂා පුහුණු වැඩසටහන් ද, රාජ්‍ය, රාජ්‍ය නොවන හා පෞද්ගලික ආයතනයන්හි සහයෙන් ක්‍රියාත්මක විය යුතු අතර රාජ්‍ය හා පෞද්ගලික විද්‍යුත් මෙන්ම මුද්‍රිත මාධ්‍ය ආයතනවල සහයෝගය ලබාගනිමින් මෙම පුහුණු වැඩ සටහන් ආරම්භ කිරීම සඳහා ජාතික වැඩ පිළිවෙළක් ක්‍රියාවට නැංවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 96/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— කලත්‍රයාගේ නොමනා ක්‍රියා නිසා අසරණභාවයට පත්වන පාර්ශවයට සහන සලසා දීම,— විවාහක අඹුසැමි යුවලක් එකම වහලක් යට ජීවත්ව සිටින අවස්ථාවලදී පුරුෂයා හෝ බිරිඳ සුරාව, සූදුව සහ වෙනත් අපචාරී කටයුතුවල යෙදෙමින් ඉඩම් හෝ ගේ දොර බඩු මුට්ටු තම පෞද්ගලික අභිමතය පරිදි විකුණමින් හෝ අන් අයට පවරමින් හැසිරීම නිසාවෙන් අනෙක් පාර්ශවයත් සමඟ දරුවන් දැඩි අසරණභාවයට පත් වන අවස්ථාවලදී එම තත්වය වළක්වා ගැනීම සඳහා අවශ්‍ය නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 98/'10

ගරු බුද්ධික පතිරණ මහතා,—චර්යා ධර්ම පිළිබඳ කාරක සභා ඇතිකිරීම,— ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ විශ්වාසවන්තභාවය හා ඔවුන් තුළ උසස් ආචාර ධර්ම පවත්වාගෙන යාමේ අවශ්‍යතාව නිසා ඒ පිළිබඳ කරුණු සොයා බැලීම සඳහා චර්යා ධර්ම පිළිබඳ කාරක සභාවක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 99/'10

ගරු බුද්ධික පතිරණ මහතා,—නව ඉලෙක්ට්‍රොනික් හැඳුනුම්පතක් නිකුත් කිරීම,— පරිපාලනය පහසු කිරීම, අපරාධ මැඩලීම සඳහා හා වෙනත් වංචනික ක්‍රියාවලට යොමුවීම අවමකිරීම සඳහා අදාළ පුද්ගලයාගේ රුධිර ගණය, බැංකු ගිණුම්, ක්‍රෙඩිට් කාඩ්, අධ්‍යාපන සුදුසුකම්, රියදුරු බලපත්‍ර හා විදේශ ගමන් බලපත්‍ර අංක ආදී වැදගත් හා අවශ්‍ය තොරතුරු ඇතුළත් නව ඉලෙක්ට්‍රොනික අංකයක් සහිත ජාතික හැඳුනුම්පතක් නිකුත් කළ යුතු බවත් ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයන්හි ජීවත්වන සියලු දෙනාගේ තොරතුරු ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් පරිගණකගත කිරීම කඩිනමින් කළ යුතු බවත් එම තොරතුරු වරින්වර යාවත්කාලීන කළයුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 100/'10

ගරු බුද්ධික පතිරණ මහතා, — පොලිස් නිලධාරීන්ට ද අවුරුදු විස්සක සේවා කාලයකින් පසු විශ්‍රාම යාමට අවස්ථාව ලබාදීම, — පොලිස් දෙපාර්තුමේන්තුවේ කාන්තා පොලිස් නිලධාරිනියන් සඳහා වන විසි වසරක සේවා කාලයකින් පසු ස්ව කැමැත්තෙන් විශ්‍රාමයාමේ හැකියාව, පොලිස් නිලධාරීන් සඳහා ද අදාළ වියයුතු යැයි ද ඒ සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 101/'10

ගරු බුද්ධික පතිරණ මහතා,—රෙගුලාසි ඉවත් කිරීමේ කාරක සභා ඇති කිරීම ,—රෙගුලාසි තැනීම මෙන්ම රෙගුලාසි ඉවත් කිරීමද නිතර සිදුවන ක්‍රියාවලියක් බැවින් කල්පැන ගිය රෙගුලාසි ඉවත් කිරීම පිළිබඳ සොයා බැලීම සඳහා රෙගුලාසි ඉවත් කිරීමේ කාරක සභා ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 102/'10

ගරු බුද්ධික පතිරණ මහතා, — සිවිල් ආරක්ෂක බලකායට අයත් නිලධාරීන්/ නිලධාරිනියන් සේවයේ ස්ථිර කිරීම, — සිවිල් ආරක්ෂක බලකායට අයත් නිලධාරීන් හා නිලධාරිනියන් සඳහා ද රජයේ අනෙකුත් ආරක්ෂක අංශවල සේවයේ නියුතු නිලධාරීන් හා නිලධාරිනියන්ට මෙන් වැටුප්, දීමනා, ස්ථිර සේවය සහ විශ්‍රාම වැටුප් සහිත රජයේ වෙනත් දෙපාර්තුමේන්තුවල මෙන් පිළිගත් නිල තත්ත්වයක් ලබාදිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 103/'10

ගරු බුද්ධික පතිරණ මහතා,—සහතික වීම පිලිබඳ කාරක සභා ඇති කිරීම,— පාර්ලිමේන්තුවේ අසන ප්‍රශ්නවලට පිළිතුරු වශයෙන් රජය දෙන සහතික හා රජයේ බැඳීම් ඇතැම් විට කඩ වන අවස්ථා දක්නට ලැබෙන බැවින්, රජය සිය වගකීම් ඉටු කරන බවට සහ ඒවා පිළිබඳව වගකියන බවට සහතික වීම සඳහා සහතික වීම පිලිබඳ කාරක සභා ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 104/'10

ගරු. (අල්හාජ්) ඒ.එච්.එම්. අස්වර් මහතා,— තල් ගස් වගාව දිරිමත් කිරීම,— "කප්පගතරු" යන නමින් හැඳින්වෙන පොදු ජනතාවට ඉමහත් ප්‍රයෝජනවත් වන තල් ගස් වගාව දිරිමත් කිරීමෙන් තල් ආශ්‍රිත නිෂ්පදන ප්‍රවර්ධනයට සියලු පියවර ගත යුතු බව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 105/'10

ගරු බුද්ධික පතිරණ මහතා, — දුම්රිය දෙපාර්තුමේන්තුව සතු ඉඩම්වල ඵලදායීතාව වැඩිකර ගැනීම,— ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තුමේන්තුව සතු ඉඩම්වල ඇති අනවසර ඉදිකිරීම් හා අනවසර පදිංචිකරුවන් කඩිනමින් ඉවත්කර නීත්‍යානුකූල ඉදිකිරීම් සම්බන්ධ ගිවිසුම් නැවත සමාලෝචනය කිරීමෙන් දෙපාර්තමේන්තුවට ලැබෙන ආදායම් වර්ධනය කළ යුතු අතර, දෙපාර්තමේන්තුවේ සංවර්ධන කටයුතු සඳහා සෘජුවම බල නොපාන්නා වූ ඉඩම් දිගුකාලීන බදු පදනමක් මත පෞද්ගලික අංශයට ලබාදී එම මුදල් දුම්රිය පද්ධතිය නවීකරණය සඳහා යොදා ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.108/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— යාචකයින්ගේ ජීවිත ආරක්ෂා කිරීම සඳහා ක්‍රමවේදයක් සැකසීම,— මේ වන විට යාචකයින්ගේ ජීවිතවලට විශාල ලෙස තර්ජන එල්ල වී තිබෙන බැවින් ඔවුන්ගේ ජීවිතවල සුරක්ෂිතතාව රැකදීම උදෙසා, ඔවුන්ට වගා කිරීම සඳහා ඉඩම් ලබා දී ඉන් ලැබෙන ආදායමෙන් ඔවුන්ගේ ජීවිතවල ආරක්ෂාව හා පෝෂණය සහතික කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.109/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— අයාලේ යන සුනඛයින්ගෙන් මිනිස් ජීවිතවලට සිදුවන හානිය වළක්වා ගැනීම සඳහා ක්‍රමවේදයක් සැකසීම,— අයාලේ යන සුනඛයින්ගෙන් මිනිස් ජීවිතවලට සිදුවන හානිය වළක්වා ගැනීමේ අරමුණින්, රජය මගින් භූමි ප්‍රමාණයක් වෙන්කොට එම ස්ථානයට නිදැල්ලේ යන සුනඛයින් ගෙන ගොස් ඔවුන් රැක බලාගැනීම සඳහා සුදුසු වැඩ පිළිවෙලක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.110/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— ළමා අපචාර සිද්ධීන් සඳහා දැඩි දඬුවම් පැනවීම,— දිවයින පුරා ළමා අපචාර හා අපයෝජනයන් දිනෙන් දින සීඝ්‍රයෙන් වර්ධනය වීමේ තත්ත්වයක් ඇති වී තිබෙන බැවින් ඒ සම්බන්ධව දැනට පවත්නා නීති රෙගුලාසි ප්‍රමාණවත් නොවන්නේ නම්, නව නීති රෙගුලාසි අලුතින් සම්මත කොට ඉතා කඩිනමින් මේ සම්බන්ධ නඩු විසඳීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.111/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා වෙරළ පිවිසුම් මාර්ග ඇති කිරීම,— දිවයිනේ වෙරළබඩ කලාපය තුළ සීඝ්‍රයෙන් සිදුවන ඉදිකිරීම් නිසාවෙන් දේශීය, විදේශීය සංචාරකයන්ට මෙන්ම ධීවරයන්ට ද වෙරළ තීරයට පිවිසීමේදී අවහිරතා ඇතිව තිබීම සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනයට මෙන්ම ධීවර කර්මාන්තයට ද බාධා ගෙන දෙන බැවින් එම තත්ත්වය වළක්වාලීම සඳහා මෙන්ම මෙම ක්ෂේත්‍ර ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව වෙරළ පිවිසුම් මාර්ග පද්ධතියක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.112/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්ගේ වැටුප් විෂමතා ඉවත් කිරීම,— විදුහල්පති සේවය, ගුරු අධ්‍යාපන සේවය, අධ්‍යාපන පරිපාලන සේවය යන සේවාවල දැඩි වැටුප් විෂමතාවක් පවතින බැවින්, එම තත්ත්වය මඟ හරවා ඔවුන්ගේ ආත්මාභිමානයට සරිලන වැටුපක් ලැබෙන පරිදි වැටුප් විෂමතා ඉවත් කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.113/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— බෞද්ධ භික්ෂු අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම,— බෞද්ධ භික්ෂූන්වහන්සේලාගේ ධර්ම ඥානය ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව උන්වහන්සේලාගේ කථන හැකියා, ශ්‍රවණ හැකියා, පරිගණක, මනෝවිද්‍යාත්මක සහ උපදේශනය පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම උදෙසා දැනට පවත්නා භික්ෂු අධ්‍යාපන ආයතනවලට පරිබාහිරව මෙම කටයුතු සඳහාම වෙන් වූ භික්ෂු අධ්‍යාපන ආයතන ඇති කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.114/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාව තුළ දැනට ක්‍රියාත්මක වන නොතාරිස් සේවාව යාවත්කාලීන කිරීම,— දිවයින තුළ ක්‍රියාත්මක වන නොතාරිස් සේවය යල්පැන ගිය නීතිවලින් සකස් වී ඇති නිසා ඒ පිළිබඳව යළි සලකා බලා වර්තමානයට ගැලපෙන ලෙස නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.115/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— වියළි කලාපීය හේන් ගොවීන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීම,— වියළි කලාපීය ප්‍රදේශවල හේන් ගොවීන් විසින් වගා කරනු ලබන වී, කුරක්කන්, මුං, තල වැනි වගාවන්හි අස්වැන්න වැඩි කර ගැනීම සහ නිෂ්පාදන සකස් කිරීම සඳහා නව තාක්ෂණය හඳුන්වාදීම තුළින් උසස් ගුණාත්මක තත්ත්වයෙන් යුතු නිෂ්පාදන සකස් කිරීම සඳහාත්, දේශීය හා ජාත්‍යන්තර වෙළඳපොළ තුළ නිෂ්පාදන අලෙවි කර ගැනීමේ පදනම ශක්තිමත් කර ගැනීම සඳහාත් සීමිත සමූපකාර සමාගම් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.116/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— ගුරු උපදේශක සේවාවක් ඇති කිරීම,— ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයක් ඇති කිරීමේ අරමුණ ඇතිව මීට වසර විස්සකට(20) පමණ පෙර සිට ආරම්භ වී ක්‍රියාත්මක වන ගුරු උපදේශක තනතුරු වෙනම ගුරු උපදේශක සේවා ඒකකයක් ලෙස ස්ථාපනය කල යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.117/'10

ගරු රුවන් රණතුංග මහතා,— අතුරු බෙදීම් තහනම් නිකුත්කර ඇති රජයේ දීමනා පත්‍ර ඉඩම්වල අතුරු බෙදීමේ බලය ප්‍රාදේශීය ලේකම්වරුන්ට පැවරීම,— ජය භූමි, ස්වර්ණ භූමි, රත්න භූමි ආදී රජයේ ඉඩම් දීමනා පත්‍රලාභීන්ගේ ඉඩම්වල අතුරු බෙදීම් තහනම් වුවත්, මුල් ඉඩම්ලාභීන්ගේ දෙවන පරම්පරාවේ අයිතිය තහවුරු කිරීමටත්, ඔවුන්ගේ ගේ දොර වතුපිටිවල සංවර්ධන කටයුතු කිරීමටත් අතුරු බෙදීම් අවශ්‍යතා පැන නැගුණු විට, පළාත් කොමසාරිස්, ඉඩම් කොමසාරිස් සහ ජනාධිපති ලේකම් කාර්යාලය හරහා දැනට ක්‍රියාත්මක වන දීර්ඝ ක්‍රියාවලිය අවම කොට අතුරු බෙදීමේ බලය ප්‍රාදේශීය ලේකම්වරුන්ට පැවරීමට අවශ්‍ය නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.118/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— තිරිඟු පිටි වෙනුවට සහල් පිටි ජනතාව අතර ජනප්‍රිය කරවීම සඳහා නව තාක්ෂණය හඳුන්වා දීම,— තිරිඟු පිටි සඳහා විදේශ රටවලට ඇදී යන විශාල ධනස්කන්ධය නවතාලීමේ අරමුණ ඇතිව ආදේශකයක් ලෙස භාවිතා කළ හැකි සහල් පිටිවලින් සැකසූ ආහාර ප්‍රචලිත කිරීම සඳහාත්, කෙඳි සහිත ධාන්‍ය වර්ගයක් වන සහල් වඩාත් සියුම් ලෙස තිරිඟු පිටි මෙන් අඹරා ගැනීම සඳහාත්, තිරිඟු පිටි ඇඹරීමට භාවිතා කරන ආකාරයේ යන්ත්‍ර සූත්‍ර සහ නව තාක්ෂණය හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.119/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— යුද්ධය නිසා ආබාධිතයන් බවට පත්වූවන්ට සහන සලසා දීම,— වසර 30කට ආසන්න කාලයක් පැවැති යුද්ධය හේතුකොට ගෙන එදිනෙදා කුලී වැඩ කොට ජීවත් වූ ජනතාවත් ස්ථිර රැකී රක්ෂා කළ ජනතාවත් අතුරින් සැලකිය යුතු ප්‍රමාණයක් අංගවිකලව ආබාධිතව ජීවන බරින් මහත් පීඩාවට පත් වී අසරණව ජීවත් වන බැවින්, ඔවුන් සඳහා යම් මාසික දීමනාවක් ලබා දීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.120/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— සියලුම ප්‍රභූ ආරක්ෂකයින් සඳහා ගමන් වියදම් දීමනාවක් ලබා දීම,— ජනාධිපති ආරක්ෂක සහ අගමැති ආරක්ෂක සේවයේ නියුක්ත නිලධාරීන්ට මෙන්ම අනෙකුත් ප්‍රභූ ආරක්ෂක සේවාවල නියුක්ත නිලධාරීන්ට ද සමාන ගමන් වියදම් දීමනාවක් ලබා දීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.122/'11

ගරු රුවන් රණතුංග මහතා,— රාජ්‍ය බැංකුවල පොලී ගෙවීම සහ පොලී අයකිරීම අතර පවතින පරතරය අඩු කිරීම,— රාජ්‍ය බැංකුවල සාමාන්‍ය ඉතුරුම් තැන්පතු සඳහා ගෙවන පොලී අනුපාතය 4 % සිට 4.5 % දක්වාද ස්ථාවර තැන්පතු සඳහා ගෙවන පොලී අනුපාතය 8 % පමණ ද වන අතර බැංකු විසින් නිවාස, ව්‍යාපාරික සහ කෘෂිකාර්මික වැනි ණය සඳහා අය කරනු ලබන පොලී අනුපාතය 12 % සිට 13 % ක් ද පමණ වන බැවින් ජනතාවට සහ කුඩා පරිමාණ ව්‍යාපාරිකයන්ට අතදීම සඳහාත් ඔවුන් දිරිගැන්වීම සඳහාත් මෙම අයකරන පොලිය සහ ගෙවන පොලිය අතර පවතින පරතරය අඩුකිරීමට පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.123/'11

ගරු රුවන් රණතුංග මහතා,— උපාධිධාරී ග්‍රාම නිලධාරීන් අගැයීම සඳහා දීමනාවක් ලබා දීම,— රාජ්‍ය සේවය ගම් මට්ටමින් ජනතාවට ලබා දීම සඳහා සේවය කරන ග්‍රාම නිලධාරීන් අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් පසුව තරඟ විභාග ලකුණු මත බඳවා ගෙන ඇතත්, දැනට සේවයේ යෙදී සිටින ග්‍රාම නිලධාරීන් අතුරින් 30 % ක් 40 % ක් පමණ පිරිසක් උපාධි සුදුසුකම් ලබා ඇති අතර එයට කිසිදු සැලකිල්ලක් මෙතෙක් දක්වා නැති බැවින් උපාධි සුදුසුකම අගැයීම සඳහා උපාධිධාරී ග්‍රාම නිලධාරීන්ට වැටුප් වැඩිවීමක් හෝ දීමනාවක් ලබා දීමට අවශ්‍ය පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.124/'11

ගරු රුවන් රණතුංග මහතා,— ශාස්ත්‍රීය ග්‍රන්ථවල හැර දෛනික පුවත්පත් සහ වාර සඟරාවල බුද්ධ රූපය පළ කිරීම තහනම් කිරීම,— දෛනික පුවත්පත්වල සහ වාර සඟරාවල බුද්ධ රූප සහ ප්‍රතිමා රූප කිසිදු පාලනයකින් තොරව අසීමිතව මුද්‍රණය කෙරෙන අතර එම පත්‍රිකා විවිධ භාණ්ඩ දවටන සහ වෙනත් අයෝග්‍ය කටයුතු සඳහා භාවිතා කිරීම බුදුරජාණන්වහන්සේට අගෞරවයක් වන බැවින් 2600 වැනි සම්බුද්ධ ජයන්තිය සැමරීම ද සැලකිල්ලට ගෙන මින් ඉදිරියට ශාස්ත්‍රීය ග්‍රන්ථවල හැර දෛනික පුවත්පත්, වාර සඟරා සහ වෙනත් පත්‍රිකාවල බුද්ධ රූප සහ ප්‍රතිමා රූප පළ කිරීම තහනම් කිරීම සඳහා අවශ්‍ය නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.